2023

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

රණවිරු සේවා අධිකාරිය
Ranaviru Seva Authority
ரணவிரு சேவா அதிகாரபை

වාර්ෂික වාර්තාව

2023



රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක අමාත්‍යාංශය

රණවිරු සේවා අධිකාරිය

මව්බිමේ ඒකීයභාවය සඳහා කැපවුණු රණවිරු ප්‍රජාව වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීම සිදුකර ඔවුන්ගේ අවශ්‍යතා කළමණාකරණය කිරීමේ වගකීම හිමිව ඇත්තේ රණවිරු සේවා අධිකාරියට වේ. 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කරන ලද රණවිරු සේවා අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. කළමණාකරන මණ්ඩලයකින් සමන්විතව පත් කරන ලද සභාපති, උප සභාපති හා අධ්‍යක්ෂක තනතුර ඇතුළු ස්ථිර කාර්ය මණ්ඩලයකින් හා ත්‍රිවිධ හමුදා අනුයුක්ත කාර්ය මණ්ඩලයක් මඟින් මෙහි සේවා ක්‍රියාත්මක කරනු ලැබේ. ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් රණවිරු සේවා අධිකාරිය පනත යටතේ ප්‍රතිලාභ ලබාගන්නා පාර්ශවයන් වේ.

ක්‍රියාන්විතයේ දී ජීවිත පූජා කළ රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන් හා රණාක්ෂිතයට පත් රණවිරුවන් ඇතුළු ඔවුන්ගේ ළඟම ඥාතීන් උදෙසා සුභසාධන සේවා සලසන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වශයෙන් රණවිරු සේවා අධිකාරිය වසර 23 ක් පුරා විශාල කාර්යයක් ඉටු කර ඇත. දීප ව්‍යාප්ත රණවිරු සංසද ජාලය මඟින් රණවිරු ප්‍රජාව ඒකරාශී කර ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර දීම හා ඔවුන් රැකබලා ගැනීමෙහි ලා රණවිරු සේවා අධිකාරිය විශිෂ්ට සේවාවක් සපයයි.

රණවිරු සේවා අධිකාරිය පනත මඟින් පවරා දී ඇති කාර්ය භාර්යය මැනවින් හඳුනා ගනිමින් රණවිරු සුභසාධනය උදෙසා ව්‍යාපෘති හා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරයි. ප්‍රතිලාභ ප්‍රජාව වෙනුවෙන් වෛද්‍ය පහසුකම් සැපයීම, රණවිරු දරුවන්ගේ අධ්‍යාපනයට සහය වීම, නිවාස සැපයීම හා එහි ලා සහය වීම, ඵලදායී ඵලදායිතා සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහය වීම, ඵලදායී සේවා නියුක්තිකයක් සුරක්ෂිත කිරීමෙහි ලා සහය වීම සහ රණවිරුවන්ගේ පසු උවටැන් හා පුනරුත්ථාපන කාර්යයන් උදෙසා මෙම ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක වේ.

රණවිරු සේවා අධිකාරිය මූල්‍යනය වන්නේ මධ්‍යම රජයේ අරමුදල් හා පරිත්‍යාගවලින් වන අතර, ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් ප්‍රධාන මූල්‍ය පරිත්‍යාග සිදුවේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි ලා භාණ්ඩාගාර ප්‍රතිපාදන අරමුදල් හා ආයතනික මුදල් තැන්පත්කර ආදායම මඟින් ප්‍රතිපාදන ලබාගන්නා අතර, 2023 වර්ෂය තුළ බොහෝ ව්‍යාපෘති සඳහා උපයෝගි කර ගන්නා ලද්දේ ආයතනික තැන්පත් ආදායම් හා පරිත්‍යාගශීලී ආධාර වේ.

රණවිරු ප්‍රජාවෙහි පුනරුත්ථාපන කාර්යය ඉටුකිරීමේ වගකීම ඍජුවම රණවිරු සේවා අධිකාරිය සතුව පවතින බැවින් පසුඋවටැන හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා විශේෂිත අවධානයක් යොමු කළ යුතුව ඇත. ආබාධිත තත්වයටපත් රණවිරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය දිනෙන් දින පිරිහීමක් වන අතර වයෝවෘධතාවය හේතුවෙන් ආබාධිත තත්ත්වයේ නොයෙක් සංකූලතා මතුවීම යන කරුණ නිසා රණවිරු සේවා අධිකාරිය රණවිරුවන් පුනරුත්ථාපනය කිරීමේ වගකීම සඳහා ඍජුවම මුහුණ දිය යුතුව ඇත.

යුද ව්‍යවසනය නිමා වී වසර ගණන් ගත වුව ද වීරෝදාර රණවිරුවන් කළ කැපවීම ශ්‍රී ලාංකිකයන් වශයෙන් අය අමතක කළ යුතු නොවේ. රණවිරු නාමයට කෘතගුණ දැක්වීම තම දැක්ම කර ගනිමින් රණවිරු ප්‍රජාව වෙනුවෙන් ගෞරවාන්විත සේවාවන් සපයන රණවිරු සේවා අධිකාරිය වෘත්තීමය මෙන් ම විධිමත් ආයතනයක් වශයෙන් තවත් වසර ගණනාවක් රණවිරු නාමය වෙනුවෙන් සේවය සැලසීමට අපේක්ෂා කරනු ලබයි.

1999 අංක 54 දරන පනත යටතේ රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

දැක්ම

“රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම”

මෙහෙවර

“ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සුරක්ෂිත කරනු පිණිස ජීවිත පුද කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා සාමාජයීය ස්ථාවරභාවයක් ඇති කිරීම මෙන් ම සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල්වල මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම. ”

රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන්ගේ පණිවුඩය



මාතෘ භූමියේ සුරක්ෂිතභාවය වෙනුවෙන් තම දිවි පරදුවට තබා රණබිමේ සටන් වැද ජීවිත පරිත්‍යාග කළ, වීරෝදාර රණවිරුවන් ඔවුන්ගේ ළඟම ඥාතීන් හා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් හා එම පවුල්වල සාමාජිකයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒවා සපුරාලීම සඳහා 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් රණවිරු සේවා අධිකාරිය පිහිටුවන ලදී.

පසුගිය 2023 වර්ෂය රණවිරු සේවා අධිකාරියට සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර වසරවලට සාපේක්ෂව භාණ්ඩාගාර ප්‍රතිපාදන අවම මට්ටමකින් හිමි වූ වසරක් වුවත්, ප්‍රධාන වශයෙන් පරිත්‍යාග හා ස්ථාවර තැන්පතු පොලී ආදායම් මත අඛණ්ඩව ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවීම සතුටට කරුණකි.

මෙම වසර තුළ ප්‍රධාන වශයෙන් අපගේ අවධානය යොමු වූයේ ආබාධිත රණවිරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම හා රණවිරු දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු ඉහළ නංවාලීම සඳහා ශිෂ්‍යාධාර පිරිනැමීම යන අංශ කෙරෙහි ය. දිර්ඝකාලීනව පසුවන ආබාධිත තත්ත්වයන් හේතුවෙන් නොයෙකුත් සංකූලතාවයන්ට මුහුණ දෙන ආබාධිත රණවිරු ප්‍රජාවෙහි කායික ශක්තිය ක්‍රමයෙන් පිරිහී යන බැවින් ඔවුන් රැක බලාගැනීම ආයතනික වශයෙන් අප සතුව පවත්නා ප්‍රධානතම කාර්යභාරය වේ.

මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ආබාධිත තත්ත්වයන් හේතුවෙන් නිවෙස් තුළට වී සිටින රණවිරුවන් සඳහා සංචරණයට අවකාශය සැලසීමේ අරමුණින් විද්‍යුත් ක්‍රියාකාරී යතුරු පැදි ලබාදීම මෙම වසරේ සිදු කරන ලද ප්‍රධාන කාර්යය වේ. එමෙන් ම වෙනත් ආබාධිත සහායක උපකරණ ලබා දෙමින් ආබාධිත රණවිරු පුනරුත්ථාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. මීට අමතරව ආබාධිත රණවිරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කරමින් ඔවුනට උචිත පරිදි සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සලසා දීමට ආධාර ලබාදීම සඳහා ද මෙම වසරේ අපගේ අවධානය යොමු විය.

රණවිරු දරුවන්ගේ අධ්‍යාපනයට සහාය වෙමින් ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍යත්ව ව්‍යාපෘතියට සමගාමීව අ.පොස (සා/පෙළ) විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් දරුවන් උදෙසා ශිෂ්‍යාධාර පිරි නැමීම සඳහා මෙම වර්ෂයේදී විශාල දායකත්වයක් ලබාදීමට අපට හැකියාව ලැබිණි. දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන් පෞද්ගලිකවම සම්බන්ධ කරගනිමින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා මුල්‍යමය දායකත්වයන් ලබාගැනීම තුළින් අප බලාපොරොත්තු වූයේ ක්‍රියාන්විතයේ දී පියා අහිමි හෝ රණක්ෂිතයට පත් රණවිරු පියවරුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණ අගයමින් ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා දිරිගැන්වීමක් ලබාදීමට ය.

නිවාස ණය හා ස්වයං රැකියා ණය ව්‍යාපෘති මඟින් රණවිරුවන්ට අවශ්‍ය ණය මුදල් හිමිකර දීමට හැකියාව ලැබුණ ද පෙර වසරවලට සාපේක්ෂව මූල්‍ය කලමණාකරනය කරමින් එම කටයුතු සිදුකිරීමේ අභයෝගයට මුහුණ දීමට 2023 වසර තුළ දී සිදු විය.

රණවිරුවන් මුහුණපාන ගැටලු සාකච්ජා කිරීම උදෙසා පවත්වන දිස්ත්‍රික් ජංගම සේවා වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කරමින් බොහෝ ගැටලු සඳහා විසඳුම් ලබාදීමට හැකිවීම සතුටට කරුණකි. එමෙන්ම නව ව්‍යවසායක වැඩසටහන් හඳුන්වා දෙමින් රටේ ආර්ථික සුරක්ෂිතතාවය කෙරෙහි රණවිරුවන් දායක කර ගැනීමට හැකිවීම අප ලද විශාල ජයග්‍රහණයකි.

සමස්තයක් වශයෙන් දිවයින පුරා විසිරි සිටින රණවිරු පුජාවේ අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුනට ගුණාත්මක සේවාවක් ලබාදීමට හැකිවීම පිළිබඳව ඉතා සතුටට පත්වෙමි. මෙම කාර්යයන් ඉටු කිරිමේදී අවශ්‍ය මග පෙන්වීම් ලබාදෙන ගරු ආරක්ෂක ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, රණවිරු සේවා අධිකාරියේ සමස්ත කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරවනීය කෘතඥතාව පුද කර සිටිමි.

මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වි යූඑස්පි එන්ඩියු
සභාපති
රණවිරු සේවා අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩලය - 2023

1.මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික)	-	සභාපති, රණවිරු සේවා අධිකාරිය
2. සෝනියා කෝට්ටෙගොඩ මහත්මිය	-	උප සභාපතිනිය - රණවිරු සේවා අධිකාරිය
3. ජයන්ත එදිරිසිංහ මහතා	-	අතිරේක ලේකම් (ආරක්ෂක සේවා) ආරක්ෂක අමාත්‍යාංශය
4. එම්.ඩී.එන්.එස් ජයරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය
5.මේජර් ජෙනරල් ඩී.සී. වීරසූරිය	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
මේජර් ජෙනරල් ඩබ්.ඒ.එස්.එස්. වනසිංහ	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
6. රියර් අද්මිරාල් කේ.ජේ.කුලරත්න	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
7. එයාර් වයිස් මාර්ෂල් ආර්.ඒ.යූ.පී. රාජපක්ෂ	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
එයාර් වයිස් මාර්ෂල් ආර්.එස්.වික්‍රමරත්න	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
8. නියෝජ්‍ය පොලිස්පති ඩබ්.ජේ. පත්මිණි	-	පොලිස් සුභසාධක හා වෛද්‍ය සේවා දිසාව ශ්‍රී ලංකා පොලිසිය
9. මේජර් ජෙනරල් ඩීඑම්එස් දිසානායක (විශ්‍රා)	-	පත්කළ සාමාජික
10. කණිෂ්ක ද සිල්වා මහතා	-	පත්කළ සාමාජික
11. ප්‍රජීවා අල්විස් මහත්මිය	-	පත්කළ සාමාජික

පටුන

01. රණක්ෂිතයටපත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීමේ වැඩසටහන

1.1. ව්‍යාපෘතිය හැඳින්වීම

1.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

1.3. 2023 වර්ෂය තුළ ආබාධිත සහායක උපකරණ ලබාදීම

1.3.1. රෝද පුටු ලබාදීම

1.3.2. ශ්‍රවණාධාර ලබාදීම

1.3.3. අත්වාරු ලබාදීම

1.3.4. කෘත්‍රිම පාද ලබාදීම හා අලුත්වැඩියා කිරීම

1.4. පරිත්‍යාගශීලී ආධාර මඟින් සහායක උපකරණ ලබාදීම

1.4.1. කෘත්‍රිම පාද

1.4.2. LN4වර්ගයේ කෘත්‍රිම අත් ලබාදීම

02. සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2.1.ව්‍යාපෘතිය හැඳින්වීම

2.2.ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

2.3. දිස්ත්‍රික්ක වශයෙන් සනීපාරක්ෂක ආධාර ලබාදීම

03.ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතිය

3.1. ව්‍යාපෘතිය හැඳින්වීම

3.2. රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය

3.3. 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

3.3.1. වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම

3.3.2. දේශීය සහ විදේශීය තරග සඳහා යොමු කරවීම

3.3.3. ක්‍රීඩකයන්ට අවශ්‍ය ශක්තිජනක පාන වර්ග ලබාදීම

3.3.4. ක්‍රීඩකයන්ට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාදීම

3.3.5. රණවිරු ගම්මාන වෙත අවශ්‍ය ක්‍රීඩා පහසුකම් ලබාදීම

3.4.හණවර්ෂයේ දී ලබා ගත් විශේෂ ජයග්‍ර 2023

3.5. රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා අංශයේ වැය දැරීම

04. "විරු සහන" නිවාස ණය ව්‍යාපෘතිය

4.1. ව්‍යාපෘතිය හැඳින්වීම

4.2. 2023 වර්ෂය තුළ ණය ලබාදීම (පළාත් හා දිස්ත්‍රික්ක වශයෙන්)

4.3. 2023 වර්ෂය තුළ නිවාස ණය ලබාදීම් මූල්‍ය තොරතුරු

05. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය

5.1. ව්‍යාපෘතිය හැඳින්වීම

5.2. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියෙහි කාර්යභාරය

06. ඉඩම් ව්‍යාපෘතිය

6.1. ව්‍යාපෘතිය හැඳින්වීම

6.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

6.3. 2023 වසර තුළ කාර්යසාධනය
6.4. රණවිරු සේවා අධිකාරිය වෙත සෘජුවම පරිත්‍යාග කර ඇති ඉඩම් තෑගි ඔප්පු මඟින් රණවිරුවන් වෙත ලබා දීම
6.4.1. කෑගල්ල ඉඩම්ලාභී රණවිරුවන් දෙදෙනා වෙත තෑගි ඔප්පු පිරිනැමීම
6.4.2. වතුමුල්ල ඉඩමේ ලොට් A දරන කොටසට අදාළ තෑගි ඔප්පුව පිරිනැමීම
6.4.3. මාලඹේ ඉඩමේ ලොට් 41F දරන ඉඩමට අදාල තෑගි ඔප්පුව පිරිනැමීම

07. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
7.1. ව්‍යාපෘතිය හැඳින්වීම
7.2. දීප ව්‍යාප්ත රණවිරු ගම්මාන
7.3. 2023 වර්ෂයේදී සපුරාලන ලද රණවිරු ගම්මාන අවශ්‍යතා

08. වෛද්‍ය ආධාර හා ණය ලබාදීම
8.1. වෛද්‍ය ආධාර ලබාදීම
8.2. වෛද්‍ය ණය ලබාදීම
8.3. වෛද්‍ය ණය හා ආධාර ලබාදීමේ ක්‍රමවේදය
8.4. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

09. අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය
9.1. ව්‍යාපෘතිය හැඳින්වීම
9.2. 6 – 11 වසර දක්වා ශිෂ්‍යත්ව ලබා දීම
9.2.1. 6-11 වසර දක්වා ශිෂ්‍යත්ව පිරිනැමීම (දිස්ත්‍රිකක්ක හා පළාත් අනුව)
9.2.2. 6-11 ශිෂ්‍යත්වවල මාසිකව ප්‍රතිලාභීන් විචලනය
9.3. අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යත්ව වැඩසටහන
9.3.1. අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යත්ව පිරිනැමීම (දිස්ත්‍රිකක්ක හා පළාත් අනුව)
9.3.2. අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යත්වවල මාසිකව ප්‍රතිලාභීන් විචලනය
9.4. උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව
9.4.1. උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම (දිස්ත්‍රිකක්ක හා පළාත් අනුව)
9.4.2. උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වවල මාසිකව ප්‍රතිලාභීන් විචලනය
9.5. විභාගවලින් විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම
9.5.1. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම
9.5.2. අ.පො.ස සා/පෙළ විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම
9.6. 2023/12/31 දිනට විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම සඳහා ලැබූ පරිත්‍යාග මුදල් ලේඛනය

10. කුසලතා ප්‍රවර්ධන ණය
10.1. ව්‍යාපෘතිය හැඳින්වීම
10.2. කුසලතා ප්‍රවර්ධන ණය ලබාදීම (දිස්ත්‍රිකක්ක හා පළාත් අනුව)

11. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය
11.1. ව්‍යාපෘතිය හැඳින්වීම
11.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය
11.3. 2023 වර්ෂයේ දී මාසිකව ශිෂ්‍යාධාර ගෙවීම
11.4. මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය දිස්ත්‍රික් පරිදි බෙදීයාම

11.5. 2023 වර්ෂය තුළ මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වෙනත් පරිත්‍යාග හා සම්බන්ධීකරණ කටයුතු

12. "විරු දිරිය" ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය

12.1. ව්‍යාපෘතිය හැඳින්වීම
12.2. 2023 වර්ෂය තුළ ණය ලබාදීම (පළාත් හා දිස්ත්‍රික් වශයෙන්)
12.3. ස්වයං රැකියා ණය ලබාගත් ව්‍යවසායකයන් වර්ගීකරණය
12.4. 2023 වර්ෂය තුළ ස්වයං රැකියා ණය ලබාදීම් මූල්‍ය තොරතුරු

13. විශ්‍රාමික රණවිරු සුඛසාධක අංශය

13.1. ව්‍යාපෘතිය හැඳින්වීම
13.2. වැඩසටහනේ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය
13.3. 2023 වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන්
13.3.1. කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන්
13.3.1.1. අනුරාධපුර මධ්‍යම නුවර ගම් පළාත රණවිරු සංසද වැඩමුළුව
13.3.1.2. ගලේවෙල, දමුණුමුල්ල වැඩමුළුව
13.3.1.3. උදාගම,නැ/මනම්පිටිය පුහුණු වැඩමුළුව
13.3.1.4. අසේලපුර, වැලිකන්ද - පුහුණු වැඩමුළුව
13.3.1.5. නාරම්මල - පුහුණු වැඩමුළුව
13.3.1.6. ගල්නෑව රණවිරු ගම්මානය - පුහුණු වැඩමුළුව
13.3.1.7. රණජයපුර රණවිරු ගම්මානය - පුහුණු වැඩමුළුව
13.3.1.8. බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව - අම්පාර
13.3.1.9. අඹගමුව -මී මැසි පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහන

14. මාපිය සුරැකුම් ව්‍යාපෘතිය

14.1. ව්‍යාපෘතිය හැඳින්වීම
14.2. රු.1500.00 බැගින් ගෙවීම
14.3. රු. 2250.00 බැගින් ගෙවීම

15. මාපිය රැකවරණ ව්‍යාපෘතිය

15.1. ව්‍යාපෘතිය හැඳින්වීම
15.2. දීමනාව සඳහා සුදුසුකම්
15.3. මාපිය රැකවරණ දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි
15.4. 2023 වර්ෂයේ ප්‍රතිලාභීන් විවලනය හා මුදල් බැර කිරීම

16. විරුසර වරප්‍රසාද කාඩ්පත් ව්‍යාපෘතිය

16.1. ව්‍යාපෘතිය හැඳින්වීම
16.2. 2023 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රමාණය
16.3. 2023 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති කාඩ්පත් ප්‍රමාණය
16.4. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද ලබා දෙනු ලබන ආයතන

17. රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන්

17.1. ව්‍යාපෘතිය හැඳින්වීම

17.2. 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සංවර්ධන වැඩසටහන්

17.3. ‘‘හෙළ විරු සුව ධරණී’’ සුව සායන වැඩසටහන් මාලාව

17.4. 2023 වර්ෂයේ සුවධරණී වැඩසටහන් පැවැත්වූ දිස්ත්‍රික්ක

18. හදිසි ආපදා ආධාර ව්‍යාපෘතිය

18.1. ව්‍යාපෘතිය හැඳින්වීම

18.2. ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

18.3. ස්වභාවික හදිසි ආපදාවන්ට ලක් වූ රණවිරු පවුල් වෙත ආධාර ලබා දීම

18.4. හදිසි අභාවයන්ට ලක් වූ රණවිරුවන් වෙනුවෙන් ආධාර ලබා දීම

18.5. 2023 වර්ෂය තුළ සමස්ත ආධාර බෙදා දීම

19. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය

19.1. ව්‍යාපෘතිය හැඳින්වීම

19.2. රණවිරු දින සැමරුම් උත්සවය

20. මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

20.1. 2023 වර්ෂය තුළ මයිලපිටිය උද්‍යානයේ නඩත්තු කටයුතු

2023 වසර තුළ ව්‍යාපෘති කාර්යසාධනය

අවසන් මූල්‍ය ප්‍රකාශනය - 2023

විගණකාධිපති වාර්තාව - 2023

2023 වසර තුළ

ක්‍රියාත්මක කරන ලද

ව්‍යාපෘති

01

රණක්ෂිතයටපත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීම

1.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියාන්විතයේ දී රණක්ෂිතයටපත් රණවිරුන්ගේ දැනට ඉතිරිව ඇති කාර්යම හැකියාව ඉහළ නැංවීම සඳහා ඔවුන් විසින් දෛනික කටයුතුවල දී සහායක උපකරණ භාවිතා කරනු ලැබේ. රණවිරුවන්ගේ ආබාධිත තත්ත්වය මග හරවා ගැනීමට ඉවහල් වන උපකරණ තාක්ෂණික වශයෙන් ඉහළ ගුණාත්මක තත්ත්වයක පැවතීම රණවිරුවාගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉවහල් වේ.

රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ දැනට ඉතිරිව ඇති කාර්යම හැකියාව ඉහළ නැංවීම සඳහා සහාය වන කෘත්‍රිම පාද, කෘත්‍රිම අත්, රෝද පුටු, අත්වාරු, කිහිළිකරු, උපැස්, සායනික සපත්තු, ශ්‍රවණ උපකරණ, සුදු සැරයටි, බස්තම්, කොමඩ් පුටු, රෝහෝ කුෂන්, වායු මෙට්ට, ජෙල් මේස්, ජෙල් ලයිනර්, විද්‍යුත් ආරෝපිත යතුරු පැදි සහ වෙනත් සහායක උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබයි.

රණක්ෂිතයටපත් රණවිරුවන් ප්‍රජා පුනරුත්ථාපන ක්‍රමවේදය යටතේ නිවෙස්ගත කර ඇති අතර ඔවුන්ගේ ආබාධිත තත්ත්වය සමග දෛනික කටයුතු සිදුකර ගැනීමේ දී ඇති වන අපහසුතාවන් මග හරවා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගයක් මෙම උපකරණ ලබාදීම මඟින් අපේක්ෂා කෙරේ. සහායක උපකරණ හුදෙක්ම තාක්ෂණික උපකරණයක් ලෙස නොව රණවිරුවාගේ ශරීරයේම කොටසක් ලෙසින් සැලකිය හැකිය. ඒ අනුව රණක්ෂිතයටපත් රණවිරුවාගේ අවශ්‍යතාවය පරිදි සහායක උපකරණ අඛණ්ඩව නොලැබීම සහ රණක්ෂිතයටපත් රණවිරුවන් ප්‍රශස්ත මට්ටමේ නොවන අබලන් වූ සහායක උපකරණ භාවිත කිරීම නිසා අතුරු ආබාධවලට ලක් වීම මග හැරීම උදෙසා අවශ්‍ය සහායක උපකරණ ලබාදීම මෙහි අරමුණයි.

1.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

i. පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ හා දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරීන් මඟින් සංසද මට්ටමින් ව්‍යාපෘතිය පිළිබඳ රණවිරුවන් දැනුවත් කිරීම.
ii. ඉල්ලුම්පත් නිකුත් කිරීම හා සම්පූර්ණ අයදුම්පත් දිස්ත්‍රික් නිලධාරී විසින් ලබා ගැනීම.
iii. ආබාධිත සහායක උපකරණ ලබාදීමේ නිර්ණායක මත පදනම්ව දිස්ත්‍රික් නිලධාරී සහ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ප්‍රමුඛතාගත කරන ලද ඉල්ලීම් හා අවශ්‍යතා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම.
iv. අංශය වෙත ලැබෙන ඉල්ලීම් පූර්ව ප්‍රතිලාභ හිමිගැන්වීම් වාර්තාව සමග ආබාධිත සහායක උපකරණ ලබාදීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
v. එක් එක් උපකරණයන් සඳහා වාර්ෂික ප්‍රතිලාභී ලේඛන සැකසීම.
vi. ආබාධිත සහායක උපකරණ ලබාදීමේ කමිටු නිර්දේශය මත මිල දී ගත යුතු උපකරණ ප්‍රමාණය ප්‍රසම්පාදන අංශය වෙත ලබාදීම.
vii. ප්‍රසම්පාදන අංශය විසින් උපකරණ මිල දී ගැනීමේ කටයුතු සිදු කර අදාළ ආයතන තෝරා ගැනීම.
viii. අදාළ ආයතන වෙත උපකරණ සැකසීම සඳහා අවැසි මිමි ලබාදීම සඳහා රණවිරුවන් යොමු කිරීම.
ix. නිෂ්පාදනය කරන ලද උපකරණ සහ අනෙකුත් සහායක උපකරණ පරීක්ෂා කර බැලීම.
x. ප්‍රතිලාභීන් වෙත කෘතිම පාද සහ අත් ඇතුළු අනෙකුත් සහායක උපකරණ ලබා දීම.

1.3. 2023 වර්ෂය තුළ ආබාධිත සහායක උපකරණ ලබාදීම

අ. අ	පළාත	දිස්ත්‍රික්කය	ආබාධිත සහායක උපකරණ/අයිතම වර්ගය							
			රෝද පුටු	අත්බාරු	ඇස් කණ්නාඩි	බෙහෙත්	වෙල් මේස්	වෙල් ලයිනර්	ශ්‍රවණාධාර	වායු මෙට්ට
1	බස්නාහිර	කොළඹ	2	7	18	-	9	-	3	-
		ගම්පහ	1	16	46	7	1	1	3	1
		කළුතර	1	4	7	-	3	-	-	-
2	මධ්‍යම	මහනුවර	1	2	12	-	1	-	1	-
		මාතලේ	-	7	28	1	-	-	-	-
		නුවරඑළිය	-	4	8	1	-	-	-	-
3	දකුණ	ගාල්ල	2	2	-	-	-	-	1	-
		මාතර	-	6	19	-	-	-	1	-
		හම්බන්තොට	-	1	1	-	1	-	-	-
4	නැගෙනහිර	මඩකලපුව	-	-	-	-	-	-	-	-
		අම්පාර	-	16	5	2	-	-	-	-
		ත්‍රිකුණාමලය	-	1	-	-	-		-	-
5	වයඹ	කුරුණෑගල	2	1	7	1	1	-	3	-
		පුත්තලම	-	7	10	1		-	1	-
6	උතුරු මැද	අනුරාධපුරය	2	28	63	4	1	-	2	-
		පොළොන්නරුව	2	2	-	2	-	-	1	-
7	ඌව	බදුල්ල	2	2	1	2	-	-	-	-
		මොණරාගල	2	4	3	1	-	-	-	-
8	සබරගමුව	රත්නපුරය	3	10	16	2	2	-	1	-
		කෑගල්ල	-	11	12	6	-	-	2	-
එකතුව			20	131	256	30	19	1	19	1

1.3.1. රෝද පුටු ලබාදීම

2023 වර්ෂය තුළ දී ආබාධිත සහායක උපකරණ ලබාදීමේ නිර්ණායක මත දැනට භාවිතා කරන රෝද පුටුව අබලන් (කැඩී බිඳී /ඉරී/තැලී/මල බැඳුණු) තත්ත්වයේ පවතින සහ රෝගාතුරවීමක් මත හදිසි අවශ්‍යතාවයක් (හදිසි සැත්කම්, අනතුරු, කායික දුබලතා) මතු වන ලද රණවිරුවන් වෙත පමණක් රෝද පුටු ලබා දී ඇත.

ඒ අනුව පූර්ණ ක්‍රියාකාරී කොමඩ් රෝද පුටු 01ක්, පූර්ණ ක්‍රියාකාරී රෝදපුටු 02ක්, කොමඩ් රෝදපුටු 02ක්, ක්‍රියාකාරී රෝද පුටු 01ක්, සාමාන්‍ය රෝද පුටු 12ක් ලෙස රෝද පුටු 18ක් රණවිරුවන් වෙත ලබාදෙන ලදී.එසේම හදිසි අවශ්‍යතා මත පරිත්‍යාගශීලී ආධාර මඟින් සාමාන්‍ය රෝදපුටු 02ක් ද රණවිරුවන් වෙත ලබා දී ඇත. එම රෝද පුටු වර්ග එක් එක් දිස්ත්‍රික්කයන්හි බෙදී යාම පහත පරිදි වේ.

අ.අ.	දිස්ත්‍රික්කය	පූර්ණ ක්‍රියාකාරී කොමඩ් රෝදපුටු	පූර්ණ ක්‍රියාකාරී රෝදපුටු	කොමඩ් රෝදපුටු	ක්‍රියාකාරී රෝදපුටු	සාමාන්‍ය රෝදපුටු	පරිත්‍යාග-සාමාන්‍ය රෝදපුටු
1	කොළඹ	-	-	1	-	1	-
2	ගම්පහ	-	-	-	-	1	-
3	කලුතර	-	-	-	-	-	1
4	ගාල්ල	-	-	1	-	1	-
5	පොළොන්නරුව	-	1	-	-	1	-
6	අනුරාධපුර	1	-	-	-	1	-
7	කුරුණෑගල	-	1	-	-	1	-
8	බදුල්ල	-	-	-	1	2	-
9	මොණරාගල	-	-	-	-	1	-
10	මහනුවර	-	-	-	-	-	1
11	රත්නපුර	-	-	-	-	3	-
එකතුව		**1**	**2**	**2**	**1**	**12**	**2**

1.3.2. ශ්‍රවණාධාර ලබාදීම

රණවිරුවන් 18 දෙනකු සඳහා අවැසි ශ්‍රවණාධාර 25ක් කැලණි කේබල්ස් ආයතනය විසින් පරිත්‍යාග කරන ලද අතර අදාළ ශ්‍රවණ තත්ත්වයන් පරීක්ෂා කිරීම සහ අනෙකුත් අමතර කොටස් සැකසීම සඳහා අවශ්‍ය වැය දැරීම් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරන ලදී. එම රණවිරුවන්ට අමතරව තවත් එක් රණවිරුවෙකු සඳහා ශ්‍රවණාධාර යුගලක් ලබාදෙන ලදී. මීට අමතරව ශ්‍රවණාධාර බැටරි යුගලක් සහ ශ්‍රවණාධාර උපකරණයක් අලුත් වැඩියා කරදීම සිදුකර ඇත.

1.3.3. අත්වාරු ලබාදීම

2021සඳහා අත්වාරු ඉල්ලීම් කරන ලද රණවිරුවන් 131 දෙනකු සඳහා අත්වාරු 262ක් දී මිල දී ගෙන ඔවුන් වෙත බෙදා දෙන ලදී.

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	අත්වාරු ප්‍රමාණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	බස්නාහිර	කොළඹ	7	14
		ගම්පහ	16	32
		කළුතර	4	8
2	මධ්‍යම	මහනුවර	2	4
		මාතලේ	7	14
		නුවරඑළිය	4	8
3	දකුණ	ගාල්ල	2	4
		මාතර	6	12
		හම්බන්තොට	1	2
4	නැගෙනහිර	මඩකලපුව		0
		අම්පාර	16	32
		ත්‍රිකුණාමලය	1	2

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	අත්වාරු ප්‍රමාණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
5	වයඹ	කුරුණෑගල	1	2
		පුත්තලම	7	14
6	උතුරු මැද	අනුරාධපුරය	28	56
		පොළොන්නරුව	2	4
7	ඌව	බදුල්ල	2	4
		මොණරාගල	4	8
8	සබරගමුව	රත්නපුරය	10	20
		කෑගල්ල	11	22
එකතුව			**131**	**262**

1.3.4. කෘත්‍රිම පාද ලබාදීම හා අලුත්වැඩියා කිරීම

2023 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් නුවරඑළිය, කෑගල්ල, කළුතර දිස්ත්‍රික්කයන්හි පදිංචි රණවිරුවන් තිදෙනකුගේ ඉල්ලීම් අනුව භාවිතා කරනු ලැබූ කෘත්‍රිම පාද අදාළ නිෂ්පාදිත ආයතනයන් මඟින් රු.171,570.00 මුදලක් වැය දරමින් අලුත් වැඩියා කර දෙන ලදී. එමෙන් ම 2021 වර්ෂය තුළ දී මිල දී ගත් කිහිලිකරු යුගල 2ක් 2023 වසරේ දී රණවිරුවන් වෙත බෙදා දී ඇත.

1.4. පරිත්‍යාගශීලී ආධාර මඟින් සහායක උපකරණ ලබාදීම

1.4.1. කෘත්‍රිම පාද

ආරක්ෂක ලේකම් ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මහතා සහ ආරක්ෂක ලේකම්තුමාගේ ජන්ම දිනය නිමිත්තෙන් එතුමන්ගේ බිරිඳ සහ දියණිය ඇතුළු පවුලේ සියලුම දෙනාගේ ධන පරිත්‍යාගයෙන් වැලිඔය ප්‍රදේශයේ අකුණු පහර ක්‍රියාන්විතයට අනුයුක්තව රාජකාරියේ නිරතව සිටිය දී ත්‍රස්තවාදී බිම් බෝම්බ ප්‍රහාරයක් හේතුවෙන් තම දකුණු පාදය අහිමි වූ බියගම රණවිරු සංසදය නියෝජනය කරන රණවිරුවෙකු වන සැරයන් මේජර් R.P.C ධර්මප්‍රිය මහතා වෙත රු.162,154.98ක් වටිනා කෘත්‍රිම පාදයක් සකසා දීමට කටයුතු කරනු ලැබීය.





රණවිරු සේවා අධිකාරිය විසින් එක්සත් රාජධානියේ සිට ක්‍රියාත්මක රණවිරු අරමුදලෙන් කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් ක්‍රියාන්විත සේවයේ යෙදී සිටිය දී ආබාධිත තත්ත්වයට පත් වූ සෙ/511152 බනි 11 මනෝජ් W.R රණවිරුවාගේ පුතණුවන් වන W.V.D දහම්ක යන දරුවා වෙත රු.157,270.96ක් වටිනා කෘත්‍රිම පාදයක් පරිත්‍යාග කරන ලදී.





1.4.2. LN4 වර්ගයේ කෘත්‍රිම අත් ලබාදීම

රණවිරු සේවා අධිකාරියේ හිටපු සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ විශේෂ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් LN4 කෘත්‍රිම අත් ලබාදීමේ ශ්‍රී ලංකාවේ සන්නාම තානාපති ලෙස කටයුතු කරන කරන මොහාමඩ් සමූන් මහතා විසින් ආබාධිත රණවිරුවන් වෙත LN4 වර්ගයේ කෘත්‍රිම අත් පරිත්‍යාග කිරීම සඳහා ඉදිරිපත් විය. මීට පෙර අවස්ථාවන් කිහිපයකදී ම ක්‍රියාන්විත හේතූන් මත මැණික් කටුව අසලින් එක් අතක් අහිමි වූ රණවිරුවන් සඳහා කෘත්‍රිම අත් සකසා දී තිබුණ ද එම කෘත්‍රිම අත භාවිතයෙන් යමක් සිදුකර ගත නොහැකි අතර එය හුදෙක්ම අතක පෙනුම ලබාගැනීම සඳහා භාවිතා කරනු ලබන ආදේශකයක් වශයෙන් පමණක් භාවිතා කරන ලදී. ඒ අනුව ගම්පහ සහ අම්පාර දිස්ත්‍රික්කයේ පදිංචි රණවිරුවන් දෙදෙනකු වෙත LN4 වර්ගයේ කෘත්‍රිම අත් ලබාදීම සිදු විය.

ඇමරිකාවේ නිෂ්පාදිත LN4 වර්ගයේ නවීන තාක්ෂණයෙන් යුත් මෙම කෘත්‍රිම අත අනෙක් අතෙහි ආධාරයෙන් ක්‍රියා කළ හැකිය. මෙම LN4 වර්ගයේ කෘත්‍රිම අතෙහි ඇඟිලි අනෙක් අතෙහි ආධාරයෙන් දිග ඇරීමට හැකි ය. ඒ අනුව මෙම කෘත්‍රිම අත මඟින් යමක් අල්ලා ගැනීමට, රඳවා ගැනීමට සහ ලිවීමට ආදී කටයුතු ස්වාධීන ලෙස කර ගැනීමට හැකියාවක් ඇත. මෙම කෘත්‍රිම අත බරින් ඉතාම අඩු අතර මිනුම් ලබා ගැනීමකින් තොරව අත සඳහා පැළඳිය හැකි ලෙස නිර්මාණය කර ඇති හෙයින් භාවිතය ඉතාම පහසු වේ. වර්තමානයේ පවතින සාම්ප්‍රදායික පුනරුත්ථාපන ක්‍රමවේදය මඟින් ලබාදෙන කෘත්‍රිම අත් වෙනුවට නව තාක්ෂණයෙන් යාවත්කාලීන වුණු ආබාධිත සහයක උපකරණ ලබාදීමේ තවත් එක් පියවරක් වශයෙන් මෙම කෘත්‍රිම අත් ලබාදීම සැලකිය හැකිය.





02

රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ නිවාසවල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියාන්විත හේතූන් මත සිය ශරීරාංග කැප කරන ලද රණක්ෂිතයට පත් රණවිරුවන් කායිකව සහ මානසිකව සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම රණවිරු සේවා අධිකාරියේ ප්‍රමුඛතම කාර්යභාරයකි.

ආබාධිත රණවිරුවාගේ ආබාධිතතාවයට සරිලන හා රණවිරුවන්ගේ භාවිතයට සුදුසු වන පරිදි සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය වී නොමැති බව ක්ෂේත්‍ර නිරීක්ෂණයන්වල දී හඳුනාගෙන ඇත. දෛනිකව සාමාන්‍ය වැසිකිළි පහසුකම් භාවිතා කිරීම හේතුවෙන් රණවිරුවාගේ කායික දුබලතාවයට සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලැබේ. ඒ අනුව ආබාධිත රණවිරුවන්ගේ ගෘහය තුළ පවතින වැසිකිලි පහසුකම් රණවිරුවාගේ වර්තමාන ආබාධිතතාවයට ගැළපෙන පරිදි අත්වැටක් සහිතව, රෝද පුටුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයට අදාළව සකස් කර ගැනීම සඳහා පවතින අවශ්‍යතාවයන් කඩිනමින් හඳුනා ගනිමින් එම පහසුකම් සහිත නාන කාමරයක් සකස්කර දීම මෙම ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණ වේ.

මෙම අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් ආබාධිත රණවිරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආබාධිත තත්ත්වයට උචිත පරිදි සෞඛ්‍යාරක්ෂිත නාන කාමරයක් ඉදි කර ගැනීම වෙනුවෙන් මූල්‍ය ආධාර පිරිනැමීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරයි.


ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් සඳහා දැනට පවතින සනීපාරක්ෂක පහසුකම් සිය ආබාධිත තත්ත්වයට සරිලන පරිදි කොමඩ් පහසුකම් සහිතව ආබාධිතතාවයට උචිත ආධාරක උපකරණ සවිකරන ලද නාන කාමරයක් ලෙස ඉදිකිරීම සඳහා රු.100,000.00 ක මූල්‍ය ආධාරයක් ද, වසර 10 කට පෙර රණවිරු සේවා අධිකාරිය මඟින් සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කරගැනීම සඳහා මූල්‍ය ආධාර ලබාදුන් රණවිරුවන් සඳහා අලුත්වැඩියා කටයුතු කරගැනීමට රු.50,000.00 ක මූල්‍ය ආධාරයක් ලබාදීම මේ යටතේ සිදු වේ.

2.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

දිස්ත්‍රික්ක වශයෙන් අයදුම්පත් ලබාදුන් පසු අයදුම්පතට අදාළව සියලු විස්තර ගෙන්වා ගැනීම සහ ගොනුව සම්පූර්ණ කරගැනීම මූලික කාර්යය වේ. එම අයදුම්පත් සඳහා සංඝ නිලධාරී, දිස්ත්‍රික්ක භාර නිලධාරී, ග්‍රාම නිලධාරි නිර්දේශ සමඟින් පළාත් නිලධාරීන් ගේ නිර්දේශය ලද පසු ව්‍යාපෘති නිර්ණායන මත පදනම්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආධාර නිර්දේශ කිරීමේ කමිටුව වෙත යොමු කරයි. කමිටු නිර්දේශය ලද අයදුම්පතට අදාළව රණවිරුවාගේ ගිණුමට මුදල් නිකුත් කරනු ලබන අතර ඉදිකිරීම් හා ප්‍රතිලාභයේ ප්‍රගතිය පිළිබඳව දිස්ත්‍රික් හා පළාත් නිලධාරී මඟින් පසුවිපරම් කටයුතු සිදු කෙරේ.

2.3. දිස්ත්‍රික්ක වශයෙන් සනීපාරක්ෂක ආධාර ලබාදීම

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
1	බස්නාහිර	කොළඹ	11
		ගම්පහ	7
		කළුතර	3
2	මධ්‍යම	මහනුවර	5
		මාතලේ	12
		නුවරඑළිය	2
3	දකුණ	ගාල්ල	14
		මාතර	2
		හම්බන්තොට	1
4	නැගෙනහිර	මඩකලපුව	-
		අම්පාර	5
		ත්‍රිකුණාමලය	1
5	වයඹ	කුරුණෑගල	18
		පුත්තලම	6
6	උතුරු මැද	අනුරාධපුරය	18
		පොළොන්නරුව	6
7	ඌව	බදුල්ල	4
		මොණරාගල	4
8	සබරගමුව	රත්නපුරය	2
		කෑගල්ල	7
එකතුව			128







03
ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතිය

3.1. ව්‍යාපෘතිය හැඳින්වීම

රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කළ ආබාධිත රණවිරුවන් කායික සහ මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඔවුන්ව ක්‍රීඩාවන් වෙත යොමු කරවීම මඟින් ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් දියුණු කිරීම මෙන් ම රණවිරු දු දරුවන්ගේ ක්‍රීඩා කුසලතා දියුණු කිරීමට උපකාර කිරීම රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා අංශයේ මූලික පරමාර්ථය වේ.

මෙහිදී ඔවුන්ගේ ක්‍රීඩා හැකියාවන් වර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම, දේශීය සහ විදේශීය තරග සඳහා යොමු කරවීම, ක්‍රීඩකයන්ට අවශ්‍ය ශක්තිජනක පාන වර්ග ලබා දීම, ක්‍රීඩකයන්ට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම, රණවිරු දු දරුවන් වෙත අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම හා රණවිරු ගම්මාන වෙත අවශ්‍ය ක්‍රීඩා පහසුකම් ලබා දීම එම වැඩසටහන් අතර වේ.

3.2. රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය

අ.අ	ක්‍රීඩකයාගේ නම	ක්‍රීඩා ඉසව්ව	වර්ගීකරණය
1	බ/නි II වයිපී අනිල් ප්‍රසන්න ජයලත්	මළල ක්‍රීඩා	T/42/F42
2	බ/නි I ඔඒ පුෂ්පකුමාර	මළල ක්‍රීඩා	F/T 44
3	කෝප්‍රල් ඒඑම්ඒ අත්තනායක	මළල ක්‍රීඩා	F46/47
4	කෝප්‍රල් ඩී ප්‍රනාන්දු	බැඩ්මින්ටන්	SU 5
5	කෝප්‍රල් ජීආර් චන්දිමාල්	බැඩ්මින්ටන්	SL 3
6	කෝප්‍රල් ඒම්කේඒස් පෙරේරා	බැඩ්මින්ටන්	SL 4
7	කෝප්‍රල් ඒච්ටීජී ක්‍රිෂාන්ත	බැඩ්මින්ටන්	SU 5
8	එස්ජේ නීල් රේමන්	බැඩ්මින්ටන්	SU 5
9	කෝප්‍රල් යුඒන්ඩී කුමාරසිරි	පිහිනුම්	S 9
10	කෝප්‍රල් ආර්ඩීඒඑස්එල් දිසානායක	පිහිනුම්	S 8
11	කෝප්‍රල් ඩබ්ඩීආර්සී මෙන්ඩිස්	පිහිනුම්	S 10
12	ටීඑම්එම්පීඑම් බංඩාර	දුනුවිදීම	A 4
13	කේඔපීඒ නීල් ප්‍රේමරත්න	දුනුවිදීම	A 4
14	කෝප්‍රල් කේපී දෙමටගේ	දුනුවිදීම	A 4
15	කෝප්‍රල් එච්සීඑන් රණවීර	දුනුවිදීම	A 4
16	ඩබ්එම් සරත් කුමාර	දුනුවිදීම	A 4
17	කෝප්‍රල් ඩීටීටී අබේසිංහ	මේස පන්දු	A 68
18	සැරයන් ඩබ්.ඒ.ඒ. උදය පුෂ්ප කුමාර	Sitting වොලිබෝල්	A 4
19	සැරයන් එම්. ජී. වික්‍රමරත්න	Sitting වොලිබෝල්	A 4
20	සැරයන් ඩී.එම්. කුලසූරිය	Sitting වොලිබෝල්	A 4
21	කෝප්‍රල් කේආර්ආර් චන්දන කුමාර	Sitting වොලිබෝල්	A 4
22	සැරයන් ඩී.පී.කේ. සෝමසේකර	Sitting වොලිබෝල්	A 4
23	සැරයන් ජී.එල්.ඒ.එම්. ගුණසේකර	Sitting වොලිබෝල්	A 4
24	සැරයන් ඩබ්.එම්. ජයවීර කුමාරතුංග	Sitting වොලිබෝල්	A 4
25	සැරයන් එස්.පී. අජන්ත බංඩාර	Sitting වොලිබෝල්	A 4
26	සැරයන් ඩබ්එන්ජේ ප්‍රනාන්දු	වායු රයිෆල්	SH 2

3.3. 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

3.3.1. වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම

2023.01.30 සහ 31 වන දින මහනුවර දිගන ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී ආබාධිත රණවිරුවන් වෙනුවෙන් බැඩ්මින්ටන් දෙදින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. පළපුරුදු ක්‍රීඩා උපදේශකයන් විසින් පවත්වන ලද මෙම පුහුණු වැඩසටහන සඳහා නුවර, ගම්පහ, නුවරඑළිය, පුත්තලම සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක නියෝජනය කරන රණවිරු සේවා අධිකාරී ක්‍රීඩා සංචිතයට අයත් ක්‍රීඩකයන් සහභාගී විය.




3.3.2. දේශීය සහ විදේශීය තරග සඳහා යොමු කරවීම

රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරන ක්‍රීඩකයින් දේශීය සහ විදේශීය තරගාවලි සඳහා යොමු කරවීම, ඔවුන්ව දිරි ගැන්වීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම රණවිරු සේවා අධිකාරිය මඟින් සිදු කරයි.

ඒ යටතේ මෙම වසරේ ආසියානික පැරා ඔලිම්පික් තරගාවලිය සඳහා සුදුසුකම් ලැබූ බ/නි ii අනිල් ප්‍රසන්න ජයලත් (T42 කාණ්ඩයේ මීටර් 100), සැරයන් ජයසිංහ රත්නායක (T4 කාණ්ඩයේ බර එසවීම), කෝප්‍රල් එම්.කේ සංජීව පෙරේරා (SL4 කාණ්ඩයේ බැට්මින්ටන්) යන ක්‍රීඩකයන් 2023.10.10 වන දින රණවිරු සේවා අධිකාරියේ ගරු සභාපතිතුමන් හමු වී ඔවුන්ගේ ඉදිරි ක්‍රීඩා කටයුතු පිළිබඳ සාකච්ඡා කරන ලදී.




3.3.3. ක්‍රීඩකයන්ට අවශ්‍ය ශක්තිජනක පාන වර්ග ලබාදීම

රණවිරු සේවා අධිකාරියේ මළල ක්‍රීඩා සංවිතයේ සහ බැඩ්මින්ටන් සංවිතයේ බනි ii අනිල් ප්‍රසන්න ජයලත් (T42 කාණ්ඩයේ මීටර් 100), කෝප්‍රල් එම්.කේ සංජීව පෙරේරා (SL4 කාණ්ඩයේ බැට්මින්ටන්), සහ සැරයන් ජයසිංහ රත්නායක (T4 කාණ්ඩයේ බර එසවීම) යන ක්‍රීඩකයන් සඳහා ඔවුන්ගේ ඉදිරි ක්‍රීඩා පුහුණුවීම් කටයුතු වෙනුවෙන් ශක්තිජනක පාන වර්ග සහ පෝෂණ අතිරේක ලබා දීම සිදු කරන ලදි.




3.3.4. ක්‍රීඩකයන්ට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබාදීම

රට වෙනුවෙන් තම ජීවිතය කැප කර ආබාධිත තත්වයට පත් සිටින නමුත් තම ක්‍රීඩා හැකියාවන් හරහා තව දුරටත් තම රටට ගෞරවයක් ගෙන ඒමට වෙහෙසෙන රණවිරුවන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම යටතේ ශ්‍රී ලංකා ආබාධිත ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරනු ලබන කෝප්‍රල් සුරංග විජේරත්න රණවිරුවා හට ක්‍රීඩා භාණ්ඩ ලබාදීම 2023.06.19 වන දින සිදු කෙරුණු අතර රණක්ෂිතයට පත් මාණ්ඩලික සැරයන් එම් එස් අනුර රණවිරුවාගේ දියණිය වන එම්.ජී චතුරිකා ප්‍රමුදිතා දියණිය හට 2023.07.26 වන දින රු. 42,500.00 ක් වටිනා ධාවන සපත්තු යුවලක් පිරිනැමීම සහ දුලානි අනන්‍යා සිල්වා රණවිරු දියණිය වෙත ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය රු. 27,100.00 මූල්‍ය ප්‍රදානයක් පිරිනැමීම 2023.04.20 වන දින සිදුවිය.




3.3.5. රණවිරු ගම්මාන වෙත අවශ්‍ය ක්‍රීඩා පහසුකම් ලබාදීම

රණවිරු ගම්මානවල ජීවත්වන රණවිරුවන්ගේ ක්‍රීඩා හැකියාවන් දියුණු කර ගැනීමට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබාදීම යටතේ 2023 වර්ෂය තුළ දී රණවිරු ගම්මාන 19ක් සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම සිදුවිය.

අ.අ	ගම්මානයේ නම	බෙදා දුන් දිනය	බෙදා දුන් ක්‍රීඩා භාණ්ඩ
1	රණජයපුර රණවිරු ගම්මානය	2023.01.04	ක්‍රිකට් බැට් -16 ක්‍රිකට් බෝල ටින් -16 ක්‍රිකට් කණු 06 බැගින්-08 වොලිබෝල් -08 වොලිබෝල් දැල් -08 කැරම් බෝඩ් -01
2	නවගමිපුර රණවිරු ගම්මානය		
3	මාබෙල්ටන් වත්ත රණවිරු ගම්මානය		
4	ඩෙන්සිල් කොබ්බෑකඩුව රණවිරු ගම්මානය		
5	පාන්ගොල්ල රණවිරු ගම්මානය		
6	වතුපිටිවල රණවිරු ගම්මානය		
7	විල්ගම්වෙහෙර රණවිරු ගම්මානය		
8	විරුසහන රණවිරු ගම්මානය		
9	බලංගොඩ රණවිරු ගම්මානය		
10	හලාවත රණවිරු ගම්මානය		
11	දියබෙදුම රණවිරු ගම්මානය		
12	මරදන්කඩවල රණවිරු ගම්මානය	2023.01.17	ක්‍රිකට් බැට් -14 ක්‍රිකට් බෝල ටින් -14 ක්‍රිකට් කණු 06 බැගින්- 06 වොලිබෝල් -02 වොලිබෝල් දැල් -02 කැරම් බෝඩ් -03
13	ගල්නෑව රණවිරු ගම්මානය		
14	දෙනවරවත්ත රණවිරු ගම්මානය		
15	කැරගල රණවිරු ගම්මානය		
16	තිලකපුර රණවිරු ගම්මානය		
17	පෙරහෙට්ටිය රණවිරු ගම්මානය		
18	අලුවිහාරය රණවිරු ගම්මානය		
19	කලවාන රණවිරු ගම්මානය		





3.4. 2023 වර්ෂයේ දී ලබා ගත් විශේෂ ජයග්‍රහණ

රණවිරු සේවා ක්‍රීඩා සංවිතයේ ක්‍රීඩක බනි ii අනිල් ප්‍රසන්න ජයලත් පැරා මළල ක්‍රීඩා තරගාවලි සඳහා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරමින් සහභාගී වන ක්‍රීඩකයෙකි. ඔහු විසින් 2023.02.28 වන දින ඩුබායි හීදි පැවැත්වූ 2023 Grand Prix පැරා ගොන්ප්‍රි මලල ක්‍රීඩා තරගාවලියේ දී T63 කණ්ඩයෙන් මීටර් 100 ඉසව්වෙන් රන් පදක්කම, 2023.05.05 වන දින සිට 2023.05.07 වන දින

දක්වා ඉන්දියාවේ බැංගලෝර් නගරයේ දී පැවැත්වූ 05 වැනි ඉන්දිය පැරා මළල ක්‍රීඩා තරගාවලියේ දී T63 කණ්ඩයෙන් මීටර් 100 ඉසව්වෙන් රිදී පදක්කම හා 2023.10.20 වන දින සිට 2023.10.28 වන දින දක්වා චීනයේ හැංසු නගරයේ දී පැවති 04 වැනි ආසියාතික පැරා මළල ක්‍රීඩා තරගාවලියේ T63 කණ්ඩයෙන් මීටර් 100 ඉසව්වෙන් රිදී පදක්කම දිනා ගන්නා ලදී.







3.5. රණවිරු සේවා **අධිකාරියේ ක්‍රීඩා** අංශයේ වැය දැරීම

අ.අ.	වැඩසටහන	වැය කිරීම් (රු)
1	ශක්ති ජනක පානයන් ලබාදීම	398,350.00
2	පුහුණු වැඩසටහන්/සාමාජික මුදල් ගෙවීම්	20,410.00
3	රණවිරු දු දරුවන් හට ක්‍රීඩා භාණ්ඩ ලබාදීම	69,610.00
4	රණවිරුවන් හට ක්‍රීඩා භාණ්ඩ ලබාදීම	202,110.00
එකතුව		**690,480.00**

04

"විරු සහන" නිවාස ණය ව්‍යාපෘතිය

4.1. ව්‍යාපෘතිය හැඳින්වීම


ක්‍රියාන්විතයේදී මියගිය රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ සහ ආබාධිත රණවිරුවන්ගේ නිවාස සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතුව සහනදායී සේවා ගාස්තුවක් පමණක් අය කරමින් රණවිරු සේවා අධිකාරිය විසින් " විරු සහන නිවාස ණය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි.

අයදුම්කරුවන්ගේ අවශ්‍යතාවය මත නව නිවසක් ඉදි කිරීම, නිවස වැඩි දියුණු කර ගැනීම හා නිවස අලුත්වැඩියා කර ගැනීම සඳහා මෙම නිවාස ණය ක්‍රමයට අයදුම් කළ හැකි ය. රණවිරු සේවා අධිකාරියේ දිස්ත්‍රික්ක භාර වැඩසටහන් නිලධාරීන් හරහා ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා අනුව වාර්ෂිකව ණය අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

"විරු සහන නිවාස ණය" ව්‍යාපෘතිය එක් අයෙකුට උපරිමය රු. 700,000.00ක ණය මුදලක්, වාරික වශයෙන් වසර 04ක කාල සීමාවකින් අය වන පරිදි, 5% ණය පොලී අනුපාතයකට යටත්ව ක්‍රියාත්මක කරනු ලබයි.

4.2. 2023 වර්ෂය තුළ ණය ලබාදීම (පළාත් හා දිස්ත්‍රික්ක වශයෙන්)

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	බස්නාහිර	කොළඹ	10
		ගම්පහ	09
		කළුතර	06
2	මධ්‍යම	මහනුවර	06
		මාතලේ	10
		නුවරඑළිය	03
3	දකුණ	ගාල්ල	03
		මාතර	05
		හම්බන්තොට	05
4	නැගෙනහිර	මඩකලපුව	-
		අම්පාර	05
		ත්‍රිකුණාමලය	-
5	වයඹ	කුරුණෑගල	18
		පුත්තලම	10
6	උතුරු මැද	අනුරාධපුරය	06
		පොළොන්නරුව	04
7	ඌව	බදුල්ල	03
		මොණරාගල	02
8	සබරගමුව	රත්නපුරය	13
		කෑගල්ල	06
එකතුව			124



4.3. 2023 වර්ෂය තුළ නිවාස ණය ලබාදීම් මූල්‍ය තොරතුරු

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	100,000	200,000	300,000	400,000	500,000	600,000	700,000
1	බස්නාහිර	කොළඹ	10	-	-	-	-	-	-	10
		ගම්පහ	09	-	1	1	2	1	-	4
		කළුතර	06	-	1	-	1	-	-	4
2	මධ්‍යම	මහනුවර	06	-	-	-	-	1	-	5
		මාතලේ	10	-	-	1	1	2	1	5
		නුවරඑළිය	03	-	-	-	1	1	-	1
3	දකුණ	ගාල්ල	03	-	-	-	-	1	-	2
		මාතර	05	-	-	1	-	-	-	4
		හම්බන්තොට	05	-	-	-	1	3	1	
4	නැගෙනහිර	මඩකලපුව	-	-	-	-	-	-	-	
		අම්පාර	05	-	1	-	2	-	-	2
		ත්‍රිකුණාමලය	-	-	-	-	-	-	-	
5	වයඹ	කුරුණෑගල	18	-	-	-	1	5	-	12
		පුත්තලම	10	-	-	-	-	1	-	9
6	උතුරු මැද	අනුරාධපුරය	06	-	-	-	-	-	-	6
		පොළොන්නරුව	04	-	-	-	-	1	-	3
7	ඌව	බදුල්ල	03	-	-	-	-	2	-	1
		මොණරාගල	02	-	-	-	-	-	-	2
8	සබරගමුව	රත්නපුරය	13	-	1	-	-	3	-	9
		කෑගල්ල	06	-	-	1	-	-	-	5
එකතුව			**124**		**4**	**4**	**9**	**21**	**2**	**84**





ණය ලබා දීමට පෙර හා ණය ලබා ගැනීමෙන් පසු නවීකරණය කරන ලද නිවාස

05
විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය

5.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති රණවිරු සේවා අධිකාරිය හා ජාතික නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන "විරු සුමිතුරු" ජාතික නිවාස ව්‍යාපෘතිය 2017 වර්ෂයෙන් ආරම්භව 2022 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ව්‍යයාපෘතියකි. ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහ ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව, ඒ හේතුවෙන් විශ්‍රාම ගන්වන ලද ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.

ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය යන සන්නද්ධ හමුදාවල ක්‍රියාන්විත ප්‍රදේශයන්හි රාජකාරි කරමින් සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතියාට සහ ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරි කරමින් සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව ආබාධිත තත්ත්වයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් සහාය සැලසීම, රණවිරුවන් විසින් සිදු කරන ලද සේවය ඇගයීම හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට රජයෙන් හා ජනතාවගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු කිරීම හා රණවිරුවන්ගේ නිවාස ඉදිකිරීමේ සහ සම්පූර්ණ කිරීමේ ගැටලුවට රජය මැදිහත් වීම තුළින් තිරසාර ජාතික විසඳුමක් ලබා දීම යන අරමුණු ඉටු කිරීම වෙනුවෙන් විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය නිර්මාණය වී තිබේ.

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය මඟින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 6 ක කාලයක් තුළ පූර්ණ නිවාස 450ක් හා අර්ධ නිවාස 4000ක් ඉදි කර අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රුපියල් මිලියන 3192 කි. පූර්ණ නිවාස සඳහා රුපියල් 1,200,000.00ක මුදලක් සමග ශ්‍රම දායකත්වය ද, අර්ධ නිවාස සඳහා රුපියල් 500,000.00 ක මුදලක් ද ලබා දීම සිදු කෙරේ. නිවාස අවශ්‍යතාව ඇති රණවිරුවන් තෝරාගැනීම රණවිරු සේවා අධිකාරියෙන් සිදුවන අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රතිලාභීන්හට මුදල් ලබා දීම සිදු කරනු ලබයි.

5.2. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියෙහි කාර්යභාරය

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය රණවිරු සේවා අධිකාරිය සහ නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි. රණවිරු සේවා අධිකාරිය සතු ප්‍රධාන වගකීම වන්නේ සුදුසු ප්‍රතිලාභීන් තෝරා නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීමයි. ප්‍රාදේශීය මට්ටමින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරන අතර ලියකියවිලි සම්පූර්ණ වූ අයදුම්පත් සඳහා රණවිරු සංසද නිලධාරී, ග්‍රාම නිලධාරී නිර්දේශය, ප්‍රාදේශීය ලේකම් නිර්දේශය සහ දිස්ත්‍රික් හා පළාත් නිලධාරීන් නිර්දේශය ලබා දීමෙන් අනතුරුව ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ. සම්පූර්ණ වූ අයදුම්පත් රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව වෙත ඉදිරිපත් කර, කමිටු නිර්දේශ ලබා නිෂ්කාශන වාර්තා ලබාගැනීම සඳහා ත්‍රිවිධ හමුදාව හා පොලීසිය වෙත යැවීම සිදු කෙරේ. නිෂ්කාශන ලැබීමෙන් අනතුරුව සභාපතිතුමාගේ අනුමැතියෙන් පසු ආධාර මුදල් ලබා දීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නාම ලේඛනයක් මඟින් ඉදිරිපත් කරයි.ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් වාරික 4 කින් ප්‍රතිලාභීන්ට ගෙවීම් කටයුතු කරනු ලැබේ. පූර්ණ නිවාස සඳහා ශ්‍රම දායකත්වය ලබා දීම රණවිරු සේවා අධිකාරිය මැදිහත්ව ත්‍රිවිධ හමුදා වෙතින් ලබාදීම සිදු කරන අතර අවශ්‍ය වූ විට සැලැස්ම වෙනස් කිරීමට ද නිර්ණායකයන්ට යටත්ව අවසර ලබා දෙයි.

06

ඉඩම් ව්‍යාපෘතිය

6.1. ව්‍යාපෘතිය හැඳින්වීම

රණවිරුවන් හා එම පවුල් රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය ඉටු කිරීමේදී වඩාත් විශේෂ වූ හා සංකීර්ණ වූ අංශයක් ලෙස අදාළ පවුල් සඳහා වාසස්ථානයක් සපයාදීම දැක්විය හැකිය. එහෙත් බොහෝ විට නිවාස හා සහන ණය ව්‍යාපෘති මාර්ගයෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා පදිංචියට නිවසක් සඳහා දිරිදුන්න ද එම නිවස ගොඩනැගීම සඳහා ස්ථානයක් (ඉඩමක්) හිමි නැති අවස්ථාවල දී රණවිරුවා හා එම පවුල් මහත් අසීරුතාවයට පත් වේ. තව ද ඉඩමක් නොමැති වීම වෙනත් සුභසාධන අවශ්‍යතාවන් ලබා ගැනීම සඳහා බාධාවක් වන අවස්ථා හඳුනාගෙන ඇත.

එම අවස්ථා හඳුනාගෙන රණවිරුවන්ගේ ඉඩම් අවශ්‍යතා කළමණාකරණය කිරීම සඳහා රණවිරු සේවා අධිකාරියේ ඉඩම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ තුළින් රණවිරුවන් වෙත සෘජුවම ඉඩම් කැබලි ලබාදීම හා වක්‍රව ඉඩම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සිදු කෙරේ.

6.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

1. ඉඩම් ලබා දීම

i. අධිකාරිය වෙත සෘජුවම පරිත්‍යාග කර ඇති ඉඩම් තාවකාලික බලපත්‍රයක් හා ඔප්පුවක් මඟින් රණවිරුවන් වෙත ලබාදීම.
ii. රණවිරුවන් වෙත වෙන් කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහවැලි අධිකාරිය සතු රජයේ ඉඩම් ලබා දීම සඳහා 2021/01 චක්‍රලේඛයට අනුව මැදිහත් වීම.
iii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් රණවිරුවන් වෙත ලබා දීම සඳහා මැදිහත් වීම.
iv. රණවිරුවන් විසින් හඳුනා ගන්නා ලද ඉඩම් ලබා ගැනීම සඳහා අප අධිකාරියේ මැදිහත් වීම මත ඉඩම අයත් ආයතනය සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය නිර්දේශය ලබා දීම.

2. ඔප්පු/බලපත්‍ර ලබා දීමට අදාළ නිර්දේශ ලබා දීම

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021/01 චක්‍රලේඛයට අනුව රජයේ ඉඩම් කොටස්වල පදිංචි වී ඇති රණවිරුවන් සඳහා රණවිරු සහන පදනම මත එම ඉඩමට අදාළ ඔප්පු/බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම.

3. රණවිරුවන් පදිංචි ඉඩම්වල පවතින ඉඩම් ගැටළු, ඉඩම් ආරවුල් විසඳීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය සහය වීම.

6.3. 2023 වසර තුළ කාර්යසාධනය

1. හඳුනාගත් ඉඩම් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉඩම් නොමැති රණවිරුවන්ගේ නාම ලේඛන යොමු කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	නාම ලේඛන යොමු කළ රණවිරුවන් ගණන
ලග්ගල	09
බෙරුවල	102
මදුරාවල	50
දඹුල්ල	09


2. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් පවත්වන ලද ඉඩම් කච්චේරි සඳහා සම්බන්ධ වීම.

ඉඩම් කච්චේරි පවත්වන ලද ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	දිනය
ලග්ගල	2023.06.28
මුන්දලම	2023.09.27
මදුරාවල	2023.10.27

3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් බෙදා දී ඇති ඉඩම් සඳහා මැදිහත් වීම

ඉඩමේ නම	මැදිහත්වීමේ ස්වභාවය
කළුතර ගමගොඩ ක්ලයිඩ්වත්ත රණවිරු ඉඩම	එම ඉඩම නැවත එළිපෙහෙලි කර මායිම් නිරවුල් කර ගැනීමට අදාළ කටයුතු සිදුකිරීම.
පාලින්ද නුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් පැලෑද රණවිරු ඉඩම	ආරක්ෂක අමාත්‍යාංශයේ, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ මැදිහත් වීම මත නිරීක්ෂණය කිරීමේ කටයුතු සිදුකිරීම.

අ.අ	දිස්ත්‍රික්කය	ඉඩම් කොටස් ලබා දීම (ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත්)	ඉඩම් කොටස් ලබා දීමට අදාල නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම	ඔප්පු/බලපත්‍ර ලබා දීමට අදාල නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම	අධිකාරිය වෙත පරිත්‍යාග කර ඇති ඉඩම් ලබාදීම/ ඔප්පු ලබාදීම	ප්‍රතිලාභයේ වටිනාකම - මුද්දර ගාස්තු (රු)
1	කොළඹ	-	-	-	1	20,740.00
2	ගම්පහ	-	-	2	1	8700
3	කළුතර	1	1	2	-	-
4	මහනුවර	-	1	-	-	-
5	මාතලේ	-	1	2	-	-
6	නුවරඑළිය	-	-	4	-	-
7	ගාල්ල	-	-	5	-	-
8	මාතර	-	-	3	-	-
9	හම්බන්තොට	-	-	3	-	-
10	අම්පාර	-	1	5	-	-
11	කුරුණෑගල	1	1	13	-	-
12	පුත්තලම	-	-	4	-	-
13	අනුරාධපුරය	-	2	24	-	-
14	පොලොන්නරුව	-	1	10	-	-
15	බදුල්ල	-	2	5	-	-
16	මොණරාගල	-	-	7	-	-
17	රත්නපුර	1	1	4	-	-
18	කෑගල්ල	-	-	2	2	36,380.00
මුළු එකතුව		**3**	**11**	**95**	**4**	**65,820.00**



6.4. රණවිරු සේවා අධිකාරිය වෙත සෘජුවම පරිත්‍යාග කර ඇති ඉඩම් තෑගි ඔප්පු මඟින් රණවිරුවන් වෙත ලබා දීම

6.4.1. කෑගල්ල ඉඩම්ලාභී රණවිරුවන් දෙදෙනා වෙත තෑගි ඔප්පු පිරිනැමීම

ඩබ්.කේ.රණවන මහතා විසින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද කෑගල්ල දිස්ත්‍රික්කයේ මොලගොඩ මංගලගම පිහිටි "හෙට්ටිපොලගොඩ හේන" නැමති ඉඩම ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව ආබාධිත වූ සෙ/412604 බනි II ආර්.පී.පී.එම්.රාජපක්ෂ සහ සෙ/701596 කෝප්‍රල් කේ.ජී.සෝමරත්න යන රණවිරුවන් දෙදෙනා වෙත 2023.03.09 වන දින තෑගි ඔප්පුවක් මඟින් පිරිනමන ලදී.





6.4.2. වතුමුල්ල ඉඩමේ ලොට් A දරන කොටසට අදාළ තෑගි ඔප්පුව පිරිනැමීම

ධනසීලි කුමාරසිංහ මහත්මිය සහ පියසීලි කුමාරසිංහ මහත්මිය විසින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි වතුමුල්ල පිහිටි දෙල්ගහවත්ත ඉඩමේ ලොට් A දරණ ඉඩම් කොටස ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව දිවිපිදූ සෙ/5E02469 ලා/කෝප්‍රල් ඊ්.එම්.එම්.සී.කේ.ඒකනායක රණවිරුවාගේ බිරිඳ වන ඩී.ඩී.එස්.කුමාරි ප්‍රනාන්දු මහත්මිය වෙත තෑගි ඔප්පුවක් මඟින් පිරිනමන ලදී.





6.4.3. මාලඹේ ඉඩමේ ලොට් 41F දරන ඉඩමට අදාල තෑගි ඔප්පුව පිරිනැමීම

කඩුවෙල ප්‍රාදේශිය සභාව මඟින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද මාලඹේ ජෝන් කීල්ස් ඉඩමේ ලොට් 41F දරණ කොටස ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව ආබාධිත වූ සෙ/410778 බනි II ඩී.එම්.එස්.කුමාරසිරි රණවිරුවා වෙත 2023.11.13 වන දින තෑගි ඔප්පුවක් මඟින් පිරිනමන ලදී.





07

රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

7.1. ව්‍යාපෘතිය හැඳින්වීම

රණවිරු ගම්මානවල පදිංචිය ආරම්භ කිරීමත් සමඟ රණවිරු පවුල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ යටිතල පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාවය යි. ඒ සඳහා මධ්‍යම ආණ්ඩුව සහ ඒ යටතේ වගකිවයුතු ආයතන දැනුවත් කොට අදාළ කටයුතු සිදු කරදීමට මැදිහත්ව ක්‍රියාකරනු ලබයි. එසේ ම ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් කණ්ඩායම් හැඟීම වර්ධනය වන පරිදි ප්‍රමුඛතා පදනම මත පළාත් මට්ටමින් ප්‍රජා ශාලා ඉදිකිරීම, සංස්කෘතික මධ්‍යස්ථාන ඇති කිරීම, පුස්තකාල ඇති කිරීම, පාරිසරික මධ්‍යස්ථාන ඇති කිරීම, ප්‍රජා ජල ව්‍යාපෘති, අභ්‍යන්තර මාර්ග නඩත්තුව හා ඉදි කිරීම් ඇතුලු රණවිරු ගම්මානවල අත්‍යවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම මෙමඟින් සිදු කරයි.

7.2. දීප ව්‍යාප්ත රණවිරු ගම්මාන

අ.අ.	ගම්මානයේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය	පදිංචි පවුල් සංඛ්‍යාව
1	සාලාව රණවිරු ගම්මානය	සීතාවක	108
2	පැලෑදගොඩ රණවිරු ගම්මානය	හෝමාගම	50
3	කෑරගල රණවිරු ගම්මානය	දොම්පේ	92
4	වතුපිටිවල රණවිරු ගම්මානය	අත්තනගල්ල	111
5	උඩුපිල රණවිරු ගම්මානය	මහර	57
6	වල්බෝතලේ රණවිරු ගම්මානය	මීරිගම	25
7	හුණුපොළ රණවිරු ගම්මානය	අත්තගල්ල	10
8	නුගේදොලවත්ත රණවිරු ගම්මානය	මීරිගම	38
9	දොඹගොඩ රණවිරු ගම්මානය	හොරණ	101
10	ගල්කැටිය - ක්ලයිඩ් කොටස රණවිරු ගම්මානය	දොඩම්ගොඩ	0
11	කිදෙල්පිටිය මිල්ලෑව රණවිරු ගම්මානය	හොරණ	27
12	ගෝවින්න රණවිරු ගම්මානය	බුලත්සිංහල	7
13	කෝපියාවත්ත - දෑවිරුගම රණවිරු ගම්මානය	කළුතර	43
14	මිල්ලනිය දාමින්දගමුව රණවිරු ගම්මානය	මිල්ලනිය	9
15	අගලවත්ත රණවිරු ගම්මානය	අගලවත්ත	1
16	යටදොලවත්ත රණවිරු ගම්මානය	මතුගම	1
17	පර්ත් ස්ටේට් රණවිරු ගම්මානය	ඉංගිරිය	19
18	පැපැලියගහලන්ද රණවිරු ගම්මානය	බේරුවල	5
19	කුරුවිට රණවිරු ගම්මානය	කුරුවිට	36
20	කලවාන රණවිරු ගම්මානය	කලවාන	4
21	බලංගොඩ රණවිරු ගම්මානය	බලංගොඩ	10
22	මාබෙල්ටන් වත්ත රණවිරු ගම්මානය	කුලියාපිටිය	8
23	ස්මිලයින් රණවිරු ගම්මානය	පන්නල	10

අ.අ.	ගම්මානයේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය	පදිංචි පවුල් සංඛ්‍යාව
24	දෙනවරවත්ත රණවිරු ගම්මානය	මාවතගම	10
25	ඩෙන්සිල් කොඩ්බෑකඩුව රණවිරු ගම්මානය	අඹන්පොල	10
26	පාන්ගොල්ල රණවිරු ගම්මානය	ඉඹ්බාගමුව	99
27	සුන්දරගම රණවිරු ගම්මානය	වාරියපොල	7
28	හලාවත රණවිරු ගම්මානය	හලාවත	11
29	රඹෑව රණවිරු ගම්මානය	රඹෑව	26
30	ගල්නෑව රණවිරු ගම්මානය	ගල්නෑව	44
31	මරදන්කඩවල රණවිරු ගම්මානය	කැකිරාව	34
32	රණජයපුර රණවිරු ගම්මනාය	කැකිරාව	1120
33	පැරකුම්දියබෙදුම-	ඇලහැර	17
34	පල්ලේකැලේ රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	31
35	විරුසහන රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	14
36	රණවිරු උයන රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	30
37	අලුවිහාරය රණවිරු ගම්මානය	මාතලේ	12
38	ජයපුරවිරු- සහන රණවිරු ගම්මානය	නාඋල	10
39	යුධ හමුදා දේශප්‍රේමී (තිලකපුර) ගම්මානය	අම්බලන්ගොඩ	9
40	ලකී විජේරත්න ගම්මානය	අක්මීමණ	24
41	මාපලගම රණවිරු ගම්මානය	නාගොඩ	34
42	වැවහමන්දුව රණවිරු ගම්මානය	මාතර	7
43	ලුණුගම්වෙහෙර රණවිරු ගම්මානය	ලුණුගම්වෙහෙර	36
44	ලුණම රණවිරු ගම්මානය	අම්බලන්තොට	31
45	පෙරහෙට්ටිය රණවිරු ගම්මානය	හාලිඇල	24
46	රණවිරුපුර රණවිරු ගම්මානය	වැල්ලවාය	12
47	හොරොම්බුව රණවිරු ගම්මානය	මොණරාගල	3
48	නවගම්පුර රණවිරු ගම්මානය	අම්පාර	20
49	වෙල්ගම්වෙහෙර රණවිරු ගම්මානය	නගර හා කඩවත් සතර	8

7.3. 2023 වර්ෂයේ දී සපුරන ලද රණවිරු ගම්මාන අවශ්‍යතා

අ.අ	ගම්මානයේ නම	අවශ්‍යතාවය	මුදල (රු)
1	ගල්නෑව රණවිරු ගම්මානය	ජල පිරිපහදු යන්ත්‍රය අලුත් වැඩියා කර ගැනීම	90,000.00
2	ඉඹ්බාගමුව ගම්මානය	පඩිපෙළ සෑදීම	149,862.00
3	ඉඹ්බාගමුව ගම්මානය	ජල ටැංකි 02 මිලදී ගැනීම	254,300.00
එකතුව			**494,162.00**



අලුත්වැඩියා කරන ලද ගල්නෑව රණවිරු ගම්මානයේ ජල පිරිපහදු යන්ත්‍රය



ඉබ්බාගමුව රණවිරු ගම්මානය සඳහා මිලදී ගන්නා ලද ජල ටැංකි

08

වෛද්‍ය ආධාර හා ණය ලබාදීම

8.1. වෛද්‍ය ආධාර ලබාදීම

ක්‍රියාන්විත හේතූන් මත රණක්ෂිතයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන් සහ ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවයේ යෙදී සිට දිවි පිදූ විවාහක රණවිරුවන්ගේ සම්පූර්ණ වැටුප නොලබන දෙමාපියන්, ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවය මඟින් විශ්‍රාම වැටුප/යැපෙන්නන්ගේ දීමනාව පමණක් ලබන දිවි පිදූ රණවිරුවන්ගේ භාර්යාවන් සහ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක, රැකියා විරහිත දූ දරුවන් සඳහා වෛද්‍ය ආධාර පිරිනමනු ලබයි.

රණවිරු ප්‍රජාව වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහාය වීම, රෝග තත්ත්වයන් මගහරවා ගැනීමට අත්‍යාවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබාදීම, ආර්ථික අපහසුතා ඇති රෝගයන්ගෙන් පෙළෙන රණක්ෂිතයටපත් රණවිරුවන් සහ රණවිරු ඥාතීන් වෙත ප්‍රතිකාර ගැනීම සඳහා සහාය වීම මෙම වැඩසටහන යටතේ සිදු වේ.

ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබාගත හැකි රෝහලක් වෙතින් අවශ්‍ය ප්‍රතිකාර, පරීක්ෂණ හෝ සැත්කම් සිදුකර ගැනීමට ප්‍රමාණවත් මූල්‍ය සහයෝගයක් ලබාදීම අත්‍යාවශ්‍ය වේ. රෝගයට ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමු වී කඩිනමින් සේවා ලබාගැනීමට මූල්‍යමය දායකත්වය ලබාදීම මෙම වැඩසටහන මඟින් සිදු වෙයි. රණවිරුවා සඳහා උපරිමය රු.500,000.00ක් ද, රණවිරු ඥාතීන් සඳහා උපරිමය රු.75,000.00ක් ද වශයෙන් මූල්‍ය ආධාර ලබා දීම මේ යටතේ සිදු වේ.

8.2. වෛද්‍ය ණය ලබාදීම

රණවිරු ප්‍රජාව මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු පදනම් කරගෙන වාර්ෂිකව විශාල පිරිසක් රණවිරු සේවා අධිකාරිය මඟින් වෛද්‍ය පහසුකම් පිළිබඳ විමසීම් කරයි. හදිසි සැත්කම් හා ප්‍රතිකාරයන් සඳහා බහුතරයක් ඉල්ලීම් යොමු කරන අතර මින් වැඩි පිරිසක් වැටුප් හා දීමනා ලබන පුද්ගලයන් වේ. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන් වූ රණවිරුවන් අදාළ ආබාධිත තත්ත්වයන්ට හේතු වූ කරුණුවල සෘජු හෝ වක්‍ර බලපෑම් මත හා වැරදි පෝෂණ පුරුදු නිසා බෝ නොවන රෝගයන්ට ගොදුරු වීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා අතරම හදිසි අනතුරුවලට මුහුණදීම නිසා ද සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට ලක් වේ.

මෙම හේතු නිසා රණවිරු ප්‍රජාව කඩිනමින් වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට රජයේ හෝ පෞද්ගලික රෝහල් කරා යොමු වන නමුත් රජයේ රෝහල් තුළ දීර්ඝ කාලීනව පොරොත්තු ලේඛනවල රැඳී සිටීමට සිදුවීම හා පුද්ගලික අංශයේ රෝහල් වෙතින් ප්‍රතිකාර ලබා ගැනීමට අධික මුදලක් වැයවීම නිසා රෝගී තත්ත්වය උත්සන්න වීම හෝ අකල් මරණයන්ට ද ගොදුරු විය හැකිය.

එවන් අවස්ථාවල දී වෛද්‍ය නිර්දේශය මත හදිසි මූල්‍යාධාර අවශ්‍ය රණවිරු ප්‍රජාව වෙනුවෙන් පොලී රහිත ණය මුදලක් ලබා දීම සඳහා වෛද්‍ය ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. රෝගයට ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමු වී කඩිනමින් සේවා ලබාගැනීමට අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබාදීම මෙමඟින් සිදු කරයි.


වෛද්‍ය ණය මුදල ලෙස රණවිරු සේවා අධිකාරිය මඟින් උපරිමය රු.500,000.00ක් ලබා දෙන අතර ණය මුදල අයකරන කාලය උපරිම වාරික 36 කි. මෙම ණය මුදල ලබාදීමේ දී කිසිදු සේවා ගාස්තුවක් අය නොකරයි. රණවිරු ප්‍රජාව වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව මෙම ණය මුදල පිරිනමයි.

8.3. වෛද්‍ය ණය හා ආධාර ලබාදීමේ ක්‍රමවේදය

වෛද්‍ය ණය හා ආධාර ලබාදීම සඳහා අංශය මඟින් දිස්ත්‍රික්ක වශයෙන් අයදුම්පත් ලබාදීම සිදුවේ. එම සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිස්ත්‍රික් නිලධාරී හා පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ නිර්දේශයන් ලබාගෙන වෛද්‍යවරයාගේ නිර්දේශයට ඉදිරිපත් කරයි. එසේ නිර්දේශිත වූ අයදුම්පත් වෛද්‍ය ආධාර/ණය කමිටුව වෙත යොමු කර ගෙවීම් සඳහා අනුමැතිය ලබාගැනීම සිදුවේ. වෛද්‍ය ආධාර හා ණය මුදල් ලබාදීමේ දී වෛද්‍ය ආධාර ලෙස ප්‍රතිකාර සඳහා වැය දැරීම් වෙනුවෙන් ප්‍රතිලාභියාගේ පෞද්ගලික ගිණුමට ප්‍රතිපූර්ණය කිරීම සහ ඉදිරියේ දී සිදුකරනු ලබන ප්‍රතිකාර සඳහා අදාළ ආයතනය වෙත මුදල් බැර කෙරේ. වෛද්‍ය ණය මුදල පමණක් අදාළ ආයතනය වෙත ගෙවීම් කිරීම සිදුකරනු ලැබේ.

8.4. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
1	බස්නාහිර	කොළඹ	11
		ගම්පහ	4
		කළුතර	-
2	මධ්‍යම	මහනුවර	2
		මාතලේ	-
		නුවරඑළිය	-
3	දකුණ	ගාල්ල	3
		මාතර	1
		හම්බන්තොට	-
4	නැගෙනහිර	මඩකලපුව	-
		අම්පාර	1
		ත්‍රිකුණාමලය	-
5	වයඹ	කුරුණෑගල	8
		පුත්තලම	3
6	උතුරු මැද	අනුරාධපුරය	7
		පොළොන්නරුව	3
7	ඌව	බදුල්ල	3
		මොණරාගල	2
8	සබරගමුව	රත්නපුරය	4
		කෑගල්ල	3
එකතුව			**55**



09

අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

9.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියාන්විතයේ දී ජීවිත පරිත්‍යාග කළ හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ දරුවන්හට අධ්‍යාපන කටයුතු සාර්ථකව ඉටු කර ගෙන යාම සඳහා මූල්‍යමය සහනයක් ලබා දෙමින් සමාජයීය හා වෘත්තීමය වශයෙන් යහපත් දරුවන් කොටසක් සමාජගත කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. උසස් අධ්‍යාපනය සඳහා තේරී පත් නො වූ දරුවන්හට වෘත්තීය නිපුණතාවන් ලබා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම හා මූල්‍යමය සහයෝගය ලබා දීම මඟින් සමස්ත රණවිරු දරු පිරිස සමාජයට වැඩදායි පුද්ගලයන් බවට පත් කිරීම මෙහි තවත් ප්‍රධාන අරමුණකි.


අධ්‍යාපන ශිෂ්‍යත්ව හා තරුණ කටයුතු අංශය යටතේ දරුවන්හට ශිෂ්‍යාධාර ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව 6 – 11 වසර දක්වා ක්‍රියාත්මක ශිෂ්‍යත්ව වැඩසටහන, අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යත්ව වැඩසටහන හා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන යනුවෙන් අධ්‍යාපන ශිෂ්‍යත්ව ත්‍රිත්වයක් ක්‍රියාත්මක වන අතර පාඨමාලා හැදෑරීම හා අධ්‍යාපනයට අවශ්‍ය පරිගණක ලබා ගැනීමටත් කුසලතා ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මීට අමතරව පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත ක්‍රියාත්මක වන මා පිය කැපකරු ශිෂ්‍යත්ව වැඩසටහන ද මෙම අංශය මඟින් ක්‍රියාත්මක වේ.

9.2. 6 – 11 වසර දක්වා ශිෂ්‍යත්ව ලබා දීම


රණවිරුවන්ගේ 6 සිට 11 වසර දක්වා අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේ දී 6 වසරේ සිට අ.පො.ස සා/පෙළ අධ්‍යාපනය තෙක් මසකට රු.500.00 බැගින් පහත සඳහන් ආකාරයට ශිෂ්‍යාධාර ලබා දෙයි. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි පරිදි ශිෂ්‍යාධාර මුදල් මාසිකව එම දරුවන්ගේ නමින් මව හෝ පියා භාරකාරත්වයේ ඇති ජාතික ඉතිරිකිරීම් බැංකු ගිණුම් සඳහා බැර කරනු ලබයි.

අ.අ	අධ්‍යාපනය ලබන වසර	ගෙවනු ලබන මාසික වාරික මුදල (රු)	ගෙවනු ලබන මුලු වාරික ගණන	ශිෂ්‍යත්ව ක්‍රමයට ඇතුළත් වන විට ඉගෙනුම ලබන ශ්‍රේණිය අනුව හිමිවන උපරිම මුදල (රු)
1	6 වසර	500.00	72	රු.36000
2	7 වසර	500.00	60	රු.30000
3	8 වසර	500.00	48	රු.24000
4	9 වසර	500.00	36	රු.18000
5	10 වසර	500.00	24	රු.12000
6	11 වසර	500.00	12	රු.6000

9.2.1. 6-11 වසර දක්වා ශිෂ්‍යත්ව පිරිනැමීම (දිස්ත්‍රික්ක හා පළාත් අනුව)



අ.අ	දිස්ත්‍රික්කය	ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය
1	කොළඹ	57
2	ගම්පහ	117
3	කළුතර	83
4	මහනුවර	132
5	මාතලේ	68
6	නුවරඑළිය	46
7	ගාල්ල	81
8	මාතර	39
9	හම්බන්තොට	64
10	මඩකලපුව	3
11	අම්පාර	74
12	ත්‍රිකුණාමළය	9
13	කුරුණෑගල	152
14	පුත්තලම	37
15	අනුරාධපුර	203
16	පොළොන්නරුව	68
17	බදුල්ල	74
18	මොණරාගල	71
19	රත්නපුර	78
20	කෑගල්ල	75
එකතුව		**1531**



9.2.2. 6-11 ශිෂ්‍යත්වවල මාසිකව ප්‍රතිලාභීන් විචලනය


අ.අ	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබාගත් ප්‍රමාණය	වැය වූ මුදල රු.
1	ජනවාරි	1348	78	434	992	496,000.00
2	පෙබරවාරි	992	98	-	1090	555,000.00
3	මාර්තු	1090	54	1	1143	571,500.00
4	අප්‍රේල්	1143	28	-	1171	585,500.00
5	මැයි	1171	26	51	1146	573,000.00
6	ජූනි	1146	68	-	1214	607,000.00
7	ජූලි	1214	77	-	1291	645,500.00
8	අගෝස්තු	1291	72	-	1363	681,500.00
9	සැප්තැම්බර්	1363	64	-	1427	713,500.00
10	ඔක්තෝබර්	1427	51	-	1478	739,000.00
11	නොවැම්බර්	1478	58	-	1536	768,000.00
12	දෙසැම්බර්	1536	-	-	1536	768,000.00

9.3. අ.පොෂ.ස උසස් පෙළ ශිෂ්‍යත්ව වැඩසටහන

රණවිරුවන්ගේ අ.පොෂ.ස උසස් පෙළ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේ දී මසකට රු.1500.00 බැගින් උපරිම වාරික 24ක් ඇතුළත් වන සේ දරුවන්ගේ උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි අදාළ මුදල් ප්‍රතිලාභී දරුවාගේ නමින් ඇති ගිණුම් වෙත මාසිකව බැර කරයි.

9.3.1. අ.පොෂ.ස උසස් පෙළ ශිෂ්‍යත්ව පිරිනැමීම (දිස්ත්‍රික්ක හා පළාත් අනුව)

අ.අ	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කොළඹ	23
2	ගම්පහ	47
3	කළුතර	35
4	කුරුණෑගල	87
5	පුත්තලම	6
6	ගාල්ල	30
7	මාතර	12
8	හම්බන්තොට	25
9	කෑගල්ල	44
10	රත්නපුර	28
11	බදුල්ල	36
12	මොණරාගල	22
13	අනුරාධපුර	64
14	පොළොන්නරුව	19
15	මහනුවර	47
16	මාතලේ	27
17	නුවර එළිය	16
18	ත්‍රිකුණාමළය	5
19	අම්පාර	37
20	මඩකලපුව	1
එකතුව		**611**



9.3.2. අ.පොෂ.ස උසස් පෙළ ශිෂ්‍යත්වවල මාසිකව ප්‍රතිලාභීන් විචලනය

අ.අ	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබාගත් ප්‍රමාණය	වැය වූ මුදල රු.
1	ජනවාරි	379	61	46	394	591,000.00
2	පෙබරවාරි	394	47	153	288	432,000.00
3	මාර්තු	288	67	2	353	529,500.00
4	අප්‍රේල්	353	30	1	382	573,000.00
5	මැයි	382	38	-	420	630,000.00


අ.අ	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබාගත් ප්‍රමාණය	වැය වූ මුදල රු.
6	ජූනි	420	22	10	432	648,000.00
7	ජූලි	432	31	23	440	660,000.00
8	අගෝස්තු	440	38	1	479	718,500.00
9	සැප්තැම්බර්	479	19	-	498	747,000.00
10	ඔක්තෝබර්	498	16		514	771,000.00
11	නොවැම්බර්	514	26	-	540	810,000.00
12	දෙසැම්බර්	540	-	-	540	810,000.00

9.4. උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව

රණවිරුවන්ගේ විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත වෙනත් උසස් අධ්‍යාපන පාඨමාලා සඳහා තේරී පත් වූ දරුවන් සඳහා මසකට රු.3000.00 බැගින් ඔවුන්ගේ අධ්‍යයන කාලය තුළ උපරිම වාරික 48ක් ඇතුළත් වන සේ ශිෂ්‍යාධාර ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු වේ.

9.4.1. උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම (දිස්ත්‍රික්ක හා පළාත් අනුව)

අ.අ.	දිස්ත්‍රික්කය	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රමාණය
1	කොළඹ	20
2	ගම්පහ	48
3	කළුතර	28
4	මහනුවර	32
5	මාතලේ	13
6	නුවර එළිය	9
7	ගාල්ල	35
8	මාතර	22
9	හම්බන්තොට	18
15	මඩකලපුව	4
16	අම්පාර	15
17	ත්‍රිකුණාමළය	4
18	කුරුණෑගල	40
19	පුත්තලම	9
20	අනුරාධපුර	49
21	පොළොන්නරුව	12
22	බදුල්ල	39
23	මොණරාගල	14
24	රත්නපුර	22
25	කෑගල්ල	24
එකතුව		**457**



9.4.2. උසස් අධ්‍යාපන ශිෂ්‍යත්වවල මාසිකව ප්‍රතිලාභීන් විවලනය

අ.අ	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබාගත් ප්‍රමාණය	වැය වූ මුදල රු.
1	ජනවාරි	291	63	19	335	1,005,000.00
2	පෙබරවාරි	335	18	29	324	972,000.00
3	මාර්තු	324	33	16	341	1,023,000.00
4	අප්‍රේල්	341	12	25	328	984,000.00
5	මැයි	328	1	5	324	972,000.00
6	ජූනි	324	47	5	366	1,098,000.00
7	ජූලි	366	21	3	384	1,152,000.00
8	අගෝස්තු	384	27	1	405	1,215,000.00
09	සැප්තැම්බර්	405	17	5	417	1,251,000.00
10	ඔක්තෝබර්	417	35	10	442	1,326,000.00
11	නොවැම්බර්	442	26	8	460	1,380,000.00
12	දෙසැම්බර්	460	-	3	457	1,371,000.00

9.5. විභාගවලින් විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම

9.5.1. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම

මෙම වැඩසටහන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර මියගිය හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ගේ තොරතුරු රණවිරු සේවා අධිකාරිය මඟින් එක් රැස් කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ. 2022 වසරේ 5 වසර ශිෂ්‍යත්වය සමත්ව 2023 වසරේ ආරක්ෂක අමාත්‍යාංශය වෙත භාරදෙනු ලැබූ අයදුම්පත් සංඛ්‍යාව 46ක් වේ.

9.5.2. අ.පොෂ. සා/පෙළ විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම

අ.පොස සා/පෙළ විශිෂ්ට ප්‍රතිඵල ලබා ගනිමින් අ.පෙ.ස උසස් පෙළ හදාරන දරුවන් ඇගයීම සඳහා පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත ඔවුන්ගේ කැමැත්ත පරිදි මසකට ශිෂ්‍යාධාර මුදලක් ලබාදීම 2023 වර්ෂය තුළ දී සිදු කෙරිණි.

9.6. 2023/12/31 දිනට විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම සඳහා ලැබූ පරිත්‍යාග මුදල් ලේඛනය

අ.අ	පරිත්‍යාගශීලීන්ගේ නම	එක් දරුවෙකු සඳහා මාසකට ලබාදෙන මුදල(රු)	ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව	මාසිකව ලබාදෙන මුදල (රු)	2023/12/31 දිනට ශිෂ්‍යාධාර සඳහා වියදම (රු)
1	හේමාල් මුණසිංහ මහතා	10,000.00	6	60,000.00	420,000.00
2	සරෝජනී මුණසිංහ මහත්මිය	10,000.00	1	10,000.00	70,000.00

අ.අ	පරිත්‍යාගශීලීන්ගේ නම	එක් දරුවෙකු සඳහා මාසකට ලබාදෙන මුදල(රු)	ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව	මාසිකව ලබාදෙන මුදල (රු)	2023/12/31 දිනට ශිෂ්‍යාධාර සඳහා වියදම (රු)
3	එව්මි සේනාධීර මහත්මිය	5,000.00	1	5,000.00	35,000.00
4	අසංකා විජේරත්න මහත්මිය	5,000.00	1	5,000.00	30,000.00
5	කනිල් විජේරත්න මහතා	5,000.00	1	5,000.00	30,000.00
6	චේත සේනාධීර මහතා	5,000.00	1	5,000.00	25,000.00
7	එක්සත් රාජධානියේ වෙසෙන සර්ව වාර්ගික ප්‍රජාව	5,000.00	10	50,000.00	250,000.00
8	ප්‍රියන්ත මුණසිංහ මහතා, අජිත් ගමගෙදර මහතා, සිරියාවතී ගමගෙදර මහත්මිය (ඉතාලිය)	5,000.00	3	15,000.00	90,000.00
9	ඉතාලියේ වෙසෙන අනෙකුත් ශ්‍රී ලාංකිකයින්	5,000.00	22	110,000.00	550,000.00
එකතුව			**46**	-	**1,500,000.00**





විශිෂ්ට ප්‍රතිඵල ලබාගත් දරුවන් ඇගයීම හා ශිෂ්‍යාධාර පිරිනැමීමේ උත්සවයන්හි විශේෂ අවස්ථා

10


කුසලතා ප්‍රවර්ධන ණය

10.1. ව්‍යාපෘතිය හැඳින්වීම

අ.පො.ස සා/පෙළ, උ/පෙළ මට්ටමින් හා උසස් අධ්‍යාපන කටයුතුවලින් අධ්‍යාපනය අවසන් කරන ලද රණවිරු දරුවන් සඳහා විවිධ පාඨමාලා ඔස්සේ තම අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යමින් අධ්‍යාපනික මාර්ගයක් ඔස්සේ අනාගතය සැලසුම් කරගැනීමට දිරිදෙමින් ඔවුනට අවශ්‍ය පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍යමය වශයෙන් සහනයක් වීම සඳහා කුසලතා ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. දරුවන් විසින් හදාරන පාඨමාලා ගාස්තුවට අදාළව රු.500,000.00ක උපරිමයකට යටත්ව අධ්‍යාපන ණය ලබාදීම හා ලැප්ටොප් ඇතුළු වෙනත් අධ්‍යාපනයට අවශ්‍ය පරිගණක උපකරණ ලබා ගැනීමට රු.300,000.00ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලබාදීම මෙමඟින් සිදු වේ.

10.2. කුසලතා ප්‍රවර්ධන ණය ලබාදීම (දිස්ත්‍රික්ක හා පළාත් අනුව)

අ.අ.	දිස්ත්‍රික්කය	ලැප්ටොප් ණය ප්‍රමාණය	පාඨමාලා ණය ප්‍රමාණය
1	ගම්පහ	2	3
2	කළුතර	-	2
3	මහනුවර	2	-
4	මාතලේ	1	-
5	නුවර එළිය	1	-
7	මාතර	2	1
9	අනුරාධපුර	2	2
10	බදුල්ල	-	1
11	මොණරාගල	1	-
12	රත්නපුර	5	1
13	කෑගල්ල	1	3
එකතුව		**17**	**13**



11

මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

11.1. ව්‍යාපෘතිය හැඳින්වීම

මාතෘභූමියේ ඒකීයභාවයත් ජනතාවගේ ආරක්ෂාවත් වෙනුවෙන් තම ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ත්‍රිවිධ හමුදා සහ පොලිස් සේවය වෙත අනුයුක්තව රාජකාරී කරමින් සිටිය දී ක්‍රියාන්විත නොවන හේතුවලින් මියගිය හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ දරුවන් වෙත මෙම ව්‍යාපෘතිය මඟින් ශිෂ්‍යාධාර පිරිනමනු ලබයි.

එම රණවිරුවන්ගේ සේවය ඇගයීමත්, ආර්ථික අපහසුතා හේතුවෙන් තම අධ්‍යාපන කටයුතු නිසියාකාරව සිදු කර ගැනීමට නොහැකි වී සිටින රණවිරු දරුවන් හට ආර්ථිකමය වශයෙන් සවියක් වීමත්, ශිෂ්‍යාධාර පිරිනැමීම තුළින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා දිරිදීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය යටතේ පළමු වසරේ සිට අ.පො.ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබන දරුවන් වෙත ශිෂ්‍යාධාර පිරිනැමීම සිදු කරයි.

ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන් රණවිරු සේවා අධිකාරියේ පනතට අනුකූල ප්‍රතිලාභී කාණ්ඩයට අයත් නොවන බැවින් මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන් කිරීමක් සිදු නොකෙරේ. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන් වෙතින් ලැබෙන මූල්‍යමය පරිත්‍යාග මත සිදු කරයි.

11.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය

ව්‍යාපෘතිය වෙත ලැබෙන නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරිත්‍යාගශීලීන් විසින් ශිෂ්‍යාධාර ලබා දීමට ඉදිරිපත් වන අවස්ථාවල දී ඔවුන් වෙත යොමු කෙරේ. ඔවුන් විසින් තෝරා ගනු ලබන අයදුම්පත් රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර එම කමිටුවේ නිර්දේශයෙන් පසුව අධ්‍යක්ෂතුමා සහ සභාපතිතුමාගේ අනුමැතිය සඳහා යොමු කෙරේ.


පරිත්‍යාගශීලීන් විසින් රණවිරු සේවා අධිකාරියේ ගිණුම වෙත මුදල් බැර කිරීමෙන් පසුව එම මුදල් අනුමැතිය ලබා ගත් ශිෂ්‍යත්වලාභියා වෙත මාසිකව ඔවුන්ගේ ගිණුම් වෙත බැර කිරීමට (ලබා දෙන ශිෂ්‍යාධාර මුදල පරිත්‍යාගශීලීන්ගේ අභිමතය පරිදි වේ) කටයුතු කරනු ලැබේ. ශිෂ්‍යත්වය ආරම්භ කිරීමෙන් පසුව ශිෂ්‍යත්වලාභියා වෙත ලිපි මඟින් දැනුම් දීමට කටයුතු කරනු ලබන අතර ශිෂ්‍යාධාර ලබන කාලය තුළ දී ඉදිරිපත් වන සෑම වාර විභාගයක ම ලකුණු ඇතුළත් අධ්‍යාපන ප්‍රගති වාර්තාව ව්‍යාපෘතිය වෙත ගෙන්වා ගෙන ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු පිළිබඳ අධීක්ෂණයක් සිදු කරයි.

11.3. 2023 වර්ෂයේ දී මාසිකව ශිෂ්‍යාධාර ගෙවීම

අ.අ	මාසය	පවත්වාගෙන එන ශිෂ්‍යත්ව ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබාගත් ප්‍රමාණය	වැය වූ මුදල (රු)
1	ජනවාරි	77	13	13	77	100,500.00
2	පෙබරවාරි	77	83	-	160	183,500.00
3	මාර්තු	160	17	01	176	263,500.00
4	අප්‍රේල්	176	-	9	167	244,500.00
5	මැයි	167	-	02	165	242,500.00
6	ජුනි	165	01	-	166	242,500.00
7	ජූලි	166	1	1	165	240,000.00
8	අගෝස්තු	165	04	03	166	242,500.00
9	සැප්තැම්බර්	166	-	-	166	242,500.00
10	ඔක්තෝබර්	166	02	02	166	242,500.00
11	නොවැම්බර්	166	-	-	166	242,500.00
12	දෙසැම්බර්	166	-	-	166	242,500.00

11.4. මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය දිස්ත්‍රික් පරිදි බෙදීයාම

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
1	බස්නාහිර	කොළඹ	05
		ගම්පහ	12
		කළුතර	07
2	මධ්‍යම	මහනුවර	13
		මාතලේ	10
		නුවරඑළිය	04
3	දකුණ	ගාල්ල	07
		මාතර	06
		හම්බන්තොට	03
4	උතුර	යාපනය	-
		මන්නාරම	-
		වව්නියාව	-
		මුලතිව්	-
		කිලිනොච්චිය	-
5	නැගෙනහිර	මඩකලපුව	-
		අම්පාර	11
		ත්‍රිකුණාමලය	-
6	වයඹ	කුරුණෑගල	21
		පුත්තලම	-
7	උතුරු මැද	අනුරාධපුරය	31
		පොළොන්නරුව	09



අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
8	උතුර	බදුල්ල	07
		මොණරාගල	06
9	සබරගමුව	රත්නපුරය	10
		කෑගල්ල	04

11.5. 2023 වර්ෂය තුළ මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වෙනත් පරිත්‍යාග හා සම්බන්ධීකරණ කටයුතු

i. මියගිය ගුවන් හමුදා රණවිරු (16105) එම්.ඩී.රෝහිත සරත් ද සිල්වා මහතාගේ වැඩිමහල් පුතු වන අ.පො.ස. උසස් පෙළ සඳහා තොරතුරු තාක්ෂණ විෂය හදාරන එම්.ඩී.අවිශ්ක චාමික ද සිල්වා දරුවාහට ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ලැප්ටොප් පරිගණකයක් 6/23/2023 දින රේඛා සේනාධීර මහත්මිය විසින් පරිත්‍යාග කරන ලදී.

ii. පොලිස් සේවයේ නියුතුව සිට මියගිය ඩබ්.එම්.පුංචි බණ්ඩා (44099) රණවිරුවාගේ දියණිය වන ඩබ්.එම්.චමින්දිකා සේවිමිණි ශිෂ්‍යාවගේ උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා රු.20,000/- ක ශිෂ්‍යත්වයක් ඉංගිරිය පදිංචි ආර්.පී.කවින්ද මහතා විසින් පිරිනමන ලදී.

iii. "ජයග්‍රහණය" සංවිධානය මඟින් ක්‍රියාත්මක ශිෂ්‍යාධාර වැඩසටහනට සමගාමීව රණවිරු දරුවන් 14 දෙනෙකු උදෙසා ශිෂ්‍යාධාර ලබා දීමට රණවිරු සේවා අධිකාරිය වෙතින් දරුන්ගේ තොරතුරු ඉල්ලුම් කළ අතර එම තොරතුරු ලබා දී රණවිරු දරුවන් 14 දෙනෙකු වෙත ශිෂ්‍යාධාර ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබීය.





12

“විරු දිරිය” ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය


12.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟ ම ඥාතීන් සහ ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන්ට ස්වශක්තියෙන් නැගී සිට යැපුම් මානසිකත්වයෙන් මිදී, තම විවිධ වූ නිසඟ හැකියාවන්ට රැකියා අවස්ථාවක් ඇති කර, නිවෙස්ගතව ගත කරන ඒකාකාරී ජීවන රටාව සඵලදායී කාර්යයන් සඳහා යොමු කිරීමේ අරමණ පෙරදැරිව මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක වේ.

අයදුම්කරුවන්ගේ අවශ්‍යතාවය මත තමන් කැමති ව්‍යවසායකත්වක් දියුණු කර ගැනීම සඳහා “රණවිරු දිරිය ණය” වැඩසටහන මඟින් ණය අයදුම් කළ හැකි ය. එක් අයෙකුට උපරිමය රු.700,000.00 ක ණය මුදලක්, වසර 04ක කාල සීමාවකින් වාරික වශයෙන් අය වන පරිදි , 5% ණය පොලී අනුපාතයකට යටත්ව ණය ලබා දීම සිදු කරනු ලැබේ.

12.2. 2023 වර්ෂය තුළ ණය ලබාදීම (පළාත් හා දිස්ත්‍රික් වශයෙන්)


අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
1	බස්නාහිර	කොළඹ	04
		ගම්පහ	05
		කළුතර	02
2	මධ්‍යම	මහනුවර	02
		මාතලේ	04
		නුවරඑළිය	-
3	දකුණ	ගාල්ල	02
		මාතර	04
		හම්බන්තොට	01
4	නැගෙනහිර	මඩකලපුව	01
		අම්පාර	02
		ත්‍රිකුණාමලය	01
5	වයඹ	කුරුණෑගල	11
		පුත්තලම	02
6	උතුරු මැද	අනුරාධපුරය	15
		පොළොන්නරුව	05
7	ඌව	බදුල්ල	-
		මොණරාගල	02
8	සබරගමුව	රත්නපුරය	08
		කෑගල්ල	02
එකතුව			73



12.3. ස්වයං රැකියා ණය ලබාගත් ව්‍යවසායකයන් වර්ගීකරණය

රණවිරු දිරිය ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ ණය මුදල් ලබාගත් රණවිරු ව්‍යවසායකයින් විවිධ කර්මාන්තවල නියැලී සිටියි. ඔවුන් අතරින් ඇතැම් පිරිස් තම නිෂ්පාදන හා සේවා අපනයන මට්ටම දක්වා වර්ධනය කර ගනිමින් පවත්වාගෙන යාම සාධනීය ලක්ෂණයකි. රණවිරු ව්‍යවසායකයින් බොහෝ දෙනෙකු ආදායම් උත්පාදක නව කර්මාන්ත කෙරෙහි යොමු වී ඇති අතර 2023 වර්ෂය තුළ පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ණය ලබාගෙන ඇත.

අ.අ.	ස්වයං රැකියා වර්ගය	නියුක්තිකයන් ගණන
1	කෘෂිකර්මාන්තය	09
2	වෙළඳසැල්/ ව්‍යාපාරික	23
3	මත්ස්‍ය කර්මාන්තය	01
4	සත්ත්ව පාලනය	07
6	බිම්මල් වගාව	02
7	නිමි ඇදුම් මැසීම හා අලෙවිය	12
8	පානීය ජල අලෙවි ව්‍යාපෘතිය	02
9	බ්ලොග් ගල්, කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය	03
10	ග්‍රිල් ගේට්ටු, වෙල්ඩින් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය	03
11	බේකරි නිෂ්පාදන	01
12	රූපලාවන්‍ය ආයතන පවත්වාගෙන යාම	02
13	විනෝදාත්මක හා සැරසිලි සේවා	01
14	අත්කම් නිර්මාන	01
15	උත්සව භාන්ඩ සැපයීම	01
16	නවාතැන් පහසුකම් සැපයීම	02
17	සංචාරකයින් හා මගීන් ප්‍රවාහනය	02
එකතුව		**73**



12.4. 2023 වර්ෂය තුළ ස්වයං රැකියා ණය ලබාදීම් මූල්‍ය තොරතුරු

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන	මුදල (රු)										
				100,000	200,000	250,000	300,000	400,000	450,000	500,000	525,000	600,000	625,000	700,000
1	බස්නාහිර	කොළඹ	4	-	-	-	-	1		-	-	-	-	3
		ගම්පහ	5	-	-	-	-	1	1	-	-	-	-	3
		කළුතර	2	-	1	-	-	-	-	-	-	-	1	-
2	මධ්‍යම	මහනුවර	2	-	-	-	-	-	-	-	-	-	-	2
		මාතලේ	4	-	-	1	-	-	-	1	-	-	-	2
		නුවරඑළිය	-	-	-	-	-	-	-	-	-	-	-	-
3	දකුණ	ගාල්ල	2	-	-	-	-	1		1	-	-	-	-
		මාතර	4	-	-	-	-	-	-	1	-	-	-	3
		හම්බන්තොට	1	-	-	-	-	-	-	-	-	-	-	1
4	නැගෙනහිර	මඩකලපුව	1	-	-	-	-	-	-	-	-	-	-	1
		අම්පාර	2	-	-	-	-	-	-	1	-	-	-	1
		ත්‍රිකුණාමලය	1	-	-	-	-		1		-	-	-	-
5	වයඹ	කුරුණෑගල	11	-	-	-	-	2	-	1	-	-	-	8
		පුත්තලම	2	-	-	-	-	-	-		-	-	-	2
6	උතුරු මැද	අනුරාධපුරය	15	-	3	-	3	-	-	6	1		-	2
		පොළොන්නරුව	5	-	-	-	-	-	-	-	-	-	-	5
7	ඌව	බදුල්ල	-	-	-	-	-	-	-	-	-	-	-	-
		මොණරාගල	2	-	1	-	-	-	-	-	-	-	-	1
8	සබරගමුව	රත්නපුරය	8	-	2	-	1	1	-	-	-	-	-	4
		කෑගල්ල	2	-	1	-	-	-	-	-	-	-	-	1
එකතුව			73	0	8	1	4	6	2	11	1	0	1	39





ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක නිරත වන රණවිරු බිරිඳකගේ ස්වයං රැකියාව අධීක්ෂණය කිරීම

13

විශ්‍රාමික රණවිරු සුධසාධක අංශය

13.1. ව්‍යාපෘතිය හැඳින්වීම

“ත්‍රිවිධ හමුදා මානව සම්පත දැයේ සංවර්ධන කාර්යය සඳහා දායක කර ගැනීමේ ව්‍යාපෘතිය” යටතේ රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කළ විශ්‍රාමික සහ රණක්ෂිතයටපත් රණවිරුවන් ප්‍රගුණ කළ කුසලතාවයන් උපයෝගී කර ගනිමින් ඔවුන්ව රැකියා අවස්ථා සඳහා යොමු කිරීම හා කෘෂිකාර්මික ව්‍යවසායකයින් බවට පත්කිරීමට අවශ්‍ය වන මූලික අඩිතාලම සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. ඒ සඳහා අවශ්‍ය වන පුහුණු වැඩමුළු, උපදේශන සේවා, පුහුණු සැසි සහ බීජ සහ පැළ වර්ග නොමිලේ සහ අවම මිල ගණන් යටතේ ලබා ගැනීමට රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශයේ ආයතන සම්බන්ධ කර දීම සහ ඔවුන්ට ඒ සඳහා මග පෙන්වීම සඳහා ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය සෘජුව දායක වේ.

මෙම ව්‍යාපෘතිය මඟින් 2023 වර්ෂය තුළ කාබනික පොහොර නිෂ්පාදනය සම්බන්ධ පුහුණු වැඩසටහන්, කාබනික ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන්, බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව හා මී මැසි පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි ලා ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල රණවිරු සේවා අධිකාරිය සමග අත්වැල් බැඳගෙන ඇත.

13.2. වැඩසටහනේ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

දිස්ත්‍රික්ක මට්ටමින් පිහිටුවා ඇති රණවිරු සංසදයන්හි සාමාජිකත්වය ලත් ඒ ඒ ව්‍යාපෘතීන්වලට හැකියාවක් සහ රුචිකත්වයන් දක්වන රණක්ෂිතයට පත් රණවිරුවන් මෙන් ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ඉල්ලීමට අනුව දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරීන්ගේ නිර්දේශ මත සහ රණවිරු සේවා අධිකාරියේ නිර්ණායක මත පදනම්ව තෝරාගත් පිරිසක් වෙනුවෙන් පුහුණු වැඩමුළු සිදු කරයි.

13.3. 2023 වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන්

අ. අ	වැඩසටහන	දිස්ත්‍රික්කය	ස්ථානය
1	කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන්	අනුරාධපුර	ම.නු.ප සංසදය
			ගල්නෑව රණවිරු ගම්මානය
			රණජයපුර රණවිරු ගම්මානය
		පොළොන්නරුව	අංක 7, සිංහ උදාගම, නැ/මනම්පිටිය
			රණවිරු ගම්මානය, අසේල පුර, වැලිකන්ද
		කුරුණෑගල	විසල් සෙවන, උඩවිල වත්ත, දඹදෙනිය, නාරම්මල
		මාතලේ	ගලේවෙල, දමුණුමුල්ල
2	කාබනික ගෙවතු වගාව සහ මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	නුවර එළිය	රණවිරු සංසදය - අඔගමුව
3	බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව	අම්පාර	අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

13.3.1. කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන්

2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි බහුල ලෙස වී වගා කරනු ලබන දිස්ත්‍රික්කයන් හි ගොවි ජනතාවගේ ආකල්පය වෙනසක් ඇති කරවීම සහ වස විසෙන් තොර කාබනික ගොවිතැන හරහා සෞඛ්‍ය සම්පන්න මෙන් ම ආර්ථික වශයෙන් සවිමත් සමාජයක් ගොඩ නැංවීම උදෙසා රණවිරුවන් සමාජ ආදර්ශයක් කොටගෙන සමස්ත ගොවි ජනතාව කාබනික ගොවිතැන වෙත යොමු වීම දිරි ගැන්වීමක් ලෙස මෙම වැඩසටහන් මාලාව සංවිධානය කරනු ලැබේ. ඒ අනුව පහත පරිදි කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන් 07 ක්‍රියාත්මක කර ඇත.

13.3.1.1. අනුරාධපුර මධ්‍යම නුවර ගම් පළාත රණවිරු සංසද වැඩමුළුව

විශ්‍රාමික රණවිරු සුභසාධන අංශයේ සංවිධානය කරන ලද 2023 වර්ෂයේ පළමු පුහුණු වැඩසටහන 2023.02.10 දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවර ගම් පළාත රණවිරු සංසද සාමාජිකයන් 30 දෙනෙකු වෙනුවෙන් පණ්ඩුලගම සදහම් නිකේතනයේ දී පවත්වන ලදී. මෙහි දී ඔවුන්ට කාබනික පොහොර නිෂ්පාදනය සහ කාබනික ගෙවතු වගාව සම්බන්ධ නවීන තාක්ෂණ ක්‍රමවේද හා කාබනික වගාව තුළින් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි සරල ක්‍රම සම්බන්ධව දැනුවත් කරනු ලැබීය.

රණවිරු සේවා අධිකාරියේ උපදෙස් මත විශ්‍රාමික රණවිරු සුභසාධන අංශයේ පුහුණු නිලධාරි කෝප්‍රල් සුමිත් කුමාර විසින් මෙම වැඩසටහන මෙහෙය වූ අතර ම.නු.ප කෘෂිකර්ම උපදේශක කාර්යාලය සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

13.3.1.2. ගලේවෙල, දමුණුමුල්ල වැඩමුළුව

මාතලේ දිස්ත්‍රික්කයේ රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් සංවිධානය කරන ලද කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන 2023.02.24 වන දින ගලේවෙල, දමුණුමුල්ල ප්‍රෙද්ශයේ දී රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් 35 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර මෙම වැඩසටහන සඳහා අතර සම්පත් දායකත්වය මහවැලි අධිකාරිය විසින් සපයන ලදී.

13.3.1.3. උදාගම, නැ/මනම්පිටිය පුහුණු වැඩමුළුව

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය ප්‍රදේශයේ රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන 2023.03.28 වන දින අංක 7, සිංහ උදාගම, නැ/මනම්පිටිය යන ලිපිනයේ දී පවත්වන ලදී. මහවැලි අධිකාරියේ සම්පත් දායකත්වය මත පවත්වන ලද මෙම වැඩසටහන සඳහා රණවිරු පවුල් සාමාජිකයින් 31 දෙනෙකුගේ සහභාගී විය.

13.3.1.4. අසේලපුර, වැලිකන්ද - පුහුණු වැඩමුළුව

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහනක් 2023.03.29 වන දින අසේලපුර රණවිරු ගම්මානය, වැලිකන්ද යන ලිපිනයේ දී රණවිරු පවුල් සාමාජිකයන් 30 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය මහවැලි අධිකාරිය මඟින් සපයන ලදි.

13.3.1.5. නාරම්මල - පුහුණු වැඩමුළුව

රණවිරු සේවා අධිකාරියේ විශ්‍රාමික රණවිරු සුභසාධන අංශයේ සංවිධානයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රදේශයේ රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු

වැඩසටහන 202.04.26 වන දින විසල් සෙවන, උඩවිලවත්ත, දඹදෙනිය, නාරම්මල යන ලිපිනයෙහි දී පවත්විණි. රණක්ෂිතයට පත් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් 28 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගී වූ අතර නාරම්මල ගොවිජන සේවා සංවර්ධන කාර්යාලයේ නිලධාරීන් විසින් සම්පත් දායකත්වය දක්වන ලදී.

13.3.1.6. ගල්නෑව රණවිරු ගම්මානය - පුහුණු වැඩමුළුව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව රණවිරු ගම්මානයේ රණවිරුවන් වෙනුවෙන් කාබනික පොහොර සහ ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහනක් 2023.07.04 වන දින ගල්නෑව රණවිරු ගම්මානය හී දී රණක්ෂිතයට පත් රණවිරු පවුල්වල සාමාජිකයන් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. ගල්නෑව ගොවිජන සේවා කාර්යාලයේ කෘෂිකර්ම උපදේශක නිලධාරී මෙහි සම්පත්දායක පුද්ගලයා වශයෙන් සහභාගී විය

13.3.1.7. රණජයපුර රණවිරු ගම්මානය - පුහුණු වැඩමුළුව

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රදේශයේ රණවිරුවන් වෙනුවෙන් පවත්වන ලද කාබනික වගාව පිළිබඳ පුහුණු වැඩසටහන රණජයපුර රණවිරු ගම්මානයේ දී 2023.07.12 රණවිරු සාමාජිකයින් 35 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සාර්ථකව පැවැත්විණි. මේ සඳහා සම්පත් දායකත්වය ඉපලෝගම කෘෂිකර්ම උපදේශක අයි.ඩී.එම්. මිහිරි මෙනෙවිය විසින් සපයන ලදී.

13.3.1.8. බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව - අම්පාර

2023.06.22 වන දින රණවිරු පවුල් සාමාජිකයන් 40 දෙනෙකුගේ සහභාගිත්වයෙන් බිම්මල් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුවක් අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් මෙහි දී ඔවුන්හට බිම්මල් වගාව සම්බන්ධ නවීන තාක්ෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් දැනුම ලබා දුන් අතර බිම්මල් වගාව හරහා ආර්ථික වශයෙන් සවිමත් රණවිරු ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබේ.

13.3.1.9. අඹගමුව -මී මැසි පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහන

නුවරඑලිය දිස්ත්‍රික්කයේ අඹගමුව රණවිරු සංසද සාමාජිකයන් උදෙසා කාබනික ගෙවතු වගාව සහ මී මැසි පාලනය සම්බන්ධ නවීන තාක්ෂණ ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් 2023.12.15 වන දින අසෝක වර්ණසූරිය, සුනිල, අලගල, ගිනිගත්හේන යන ලිපිනයේ දී පවත්වන ලදී. මෙහි දී පලතුරු හා එළවළු විජලනය සම්බන්ධව ද දැනුවත් කරන ලද අතර ගිනිගත්හේන කෘෂිකර්ම නිලධාරිතුමන් විසින් අවශ්‍ය සම්පත් දායකත්වය සපයනු ලැබීය.





14

මාපිය සුරැකුම් ව්‍යාපෘතිය

14.1. ව්‍යාපෘතිය හැඳින්වීම

රණවිරු සේවා අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන "මාපිය සුරැකුම" ව්‍යාපෘතියෙන් 2007.11.21 දිනට පෙර මියගිය විවාහක රණවිරුවන්ගේ කිසිදු වැටුපක් හෝ විශ්‍රාම වැටුපක් නොලබන දෙමව්පියන් වෙත මෙම දීමනාව ලබා දෙයි. මව් පිය දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් ජීවත්ව සිටී නම් මාසිකව රු.2,250.00 බැගින් ද, දෙදෙනා ම ජීවත්ව සිටී නම් එක් අයෙකුට රු.1,500.00 බැගින් රු.3,000.00 ක් ද වන පරිදි මෙම දීමනාව ගෙවනු ලැබේ. මෙම මුදල ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් හරහා මාසිකව ලබා දීම සිදු කරයි.

සෑම වසරකම නොවැම්බර් මස ප්‍රතිලාභීන්ගේ ජීවත්වීමේ සහතිකය ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකමෙග් නිර්දේශය සහිතව කැඳවීම් කරනු ලබයි. එය සම්පූර්ණ කර අධිකාරිය වෙත යොමු කිරීම සඳහා ඔවුන්ට මාස 03 ක කාලයක් ලබාදෙයි. අදාළ තොරතුරු පත්‍රිකාව නියමිත දිනට යොමු නොකළ අයවලුන්ගේ ගිණුම් ආසන්න මාසයේදී තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරනු ලබයි. එසේ වුවද, යම් අයෙක් තොරතුරු පත්‍රිකාව පසුව හෝ යොමු කළ හොත් ගිණුම් නැවත සක්‍රිය කරනු ලැබේ.

14.2. රු.1500.00 බැගින් ගෙවීම


2022 දෙසැම්බර් මස අවසානයේ මාසිකව රු.1500 බැගින් කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 305ක් වේ. එම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2023 වර්ෂය ආරම්භයේ දී ව්‍යාපෘතියේ පවත්වාගෙන එන ගිණුම් සේ සලකනු ලැබේ. ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා රු.1500.00 බැගින් ගෙවීම සඳහා ව්‍යාපෘතිය වෙත අලුතින් එකතු කර ගත් ප්‍රමාණය හා අත්හිටුවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව එක් එක් මාසවල වැය දැරීම පහත පරිදි වේ.

අ. අ	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අලුතින් එකතු වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ඉවත් කිරීම්	ප්‍රතිලාභ ලබා ගත් ප්‍රමාණය	වැය වූ මුදල (රු)
1	ජනවාරි	305	16	8	313	469,500.00
2	පෙබරවාරි	313	7	35	285	427,500.00
3	මාර්තු	285	4	3	286	429,000.00
4	අප්‍රේල්	286	1	-	287	430,500.00
5	මැයි	287	2	-	289	433,500.00
6	ජුනි	289	2	-	293	439,500.00
7	ජුලි	293	4	-	297	445,500.00
8	අගෝස්තු	297	3	-	300	450,000.00
9	සැප්තැම්බර්	300	-	-	300	450,000.00
10	ඔක්තෝබර්	300	-	38	262	393,000.00
11	නොවැම්බර්	262	-	-	262	393,000.00
12	දෙසැම්බර්	262	7	45	260	390,000.00
එකතුව						**5,151,000.00**

14.3. රු. 2250.00 බැගින් ගෙවීම

2022 දෙසැම්බර් මස අවසානයේ මාසිකව රු.2250 බැගින් කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 390 ක් වේ. එම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2023 වර්ෂය ආරම්භයේ දී ව්‍යාපෘතියේ පවත්වාගෙන එන ගිණුම් සේ සලකනු ලැබේ. ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා රු.2250.00 බැගින් ගෙවීම සඳහා ව්‍යාපෘතිය වෙත අලුතින් එකතු කර ගත් ප්‍රමාණය හා අත්හිටුවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව එක් එක් මාසවල වැය දැරීම පහත පරිදි වේ.

අ.අ	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	අලුතින් එකතු වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ඉවත් කිරීම්	මාසිකව රු.2250 බැගින් ප්‍රතිලාභ ලබා ගත් ප්‍රමාණය	වැය වූ මුදල (රු)
1	ජනවාරි	390)	19	16	393	884,250.00
2	පෙබරවාරි	393	8	66	335	753,750.00
3	මාර්තු	335	7	-	342	769,500.00
4	අප්‍රේල්	342	4	-	346	778,500.00
5	මැයි	346	3	-	349	785,250.00
6	ජුනි	349	2	-	354	796,500.00
7	ජුලි	354	3	-	357	803,250.00
8	අගෝස්තු	357	3	-	360	810,000.00
9	සැප්තැම්බර්	360	2	3	359	807,750.00
10	ඔක්තෝබර්	359	2	61	300	675,000.00
11	නොවැම්බර්	300	-	3	297	668,250.00
12	දෙසැම්බර්	297	14	64	296	666,000.00
එකතුව						**9,198,000.00**



15
මාපිය රැකවරණ ව්‍යාපෘතිය

15.1. ව්‍යාපෘතිය හැඳින්වීම

යුද්ධයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවි පිදූ, අතුරුදහන් හා ආබාධිත තත්ත්වයට පත්ව වෛද්‍ය හේතු මත විශ්‍රාමිකව සිටින රණවිරු සේවා අධිකාරියේ පනත යටතට ගැනෙන රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන් වෙත ගෙවනු ලබන මාපිය රැකවරණ දීමනාව ලෙස රුපියල් 750.00 මසකට වරක් ලබා දීම රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙතින් සිදු කරනු ලබයි. මෙම දීමනාව සඳහා මුදල් බැර කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන රාජ්‍ය බැංකුවලින් නිකුත් කරනු ලබන මාපිය රැකවරණ ගිණුම් සඳහා පමණි.

පවුලක රණවිරු සාමාජිකයින් කිහිප දෙනෙකු සිටිය ද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රුපියල් 750 ක් බැගිනි. රණවිරු මව හෝ පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වන අතර කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක. මව පියා මියගිය වහාම අදාළ බැංකුව වෙත පාස් පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත අදාළ මරණයට පත් අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර මාස 06 කට වරක් දීමනාලාභියා ජීවත්ව සිටින බවට ග්‍රාම සේවා නිලධාරී විසින් සහතික කරන ලද ජීවත් වීමේ සහතිකයක් රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ.

15.2. දීමනාව සඳහා සුදුසුකම්

යුද්ධයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය සහ අතුරුදහන්, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන්ගේ දෙමාපියන් වෙත ඉදුරාම ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව වෛද්‍ය හේතූන් මත ආබාධිත විශ්‍රාමික ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන්ගේ දෙමාපියන් වෙත මෙම දීමනාව හිමි ගැන්වේ. රණවිරු දරුවන් කිහිප දෙනෙකු සිටියද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රුපියල් 750.00 ක් බැගිනි. මියගිය රණවිරුවෙකු සහ ජීවත්වන රණවිරු දරුවෙකු සිටි නම්, මියගිය රණවිරුවා වෙනුවෙන් දීමනාව ගෙවනු ලැබේ.

දීමනාලාභියා මාස 06 කට වතාවක් සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර ජීවත්ව සිටින බවට සහතිකයක් ග්‍රාම සේවා නිලධාරී විසින් සහතික කිරීමෙන් පසු රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ. මව, පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වේ. කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක. මව පියා මියගිය වහා අදාළ බැංකුව වෙත පාස්පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත උක්ත අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

15.3. මාපිය රැකවරණ දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි

i. මාපිය රැකවරණ අයදුම්පත් සම්පූර්ණ කිරීම
ii. මියගිය රණවිරුවෙකු නම් රණවිරුවාගේ මරණ සහතිකයේ සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ඡායා පිටපතක්
iii. ඉඳුරාම ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව වෛද්‍ය හේතූන් මත ආබාධිත විශ්‍රාමික රණවිරුවෙකු නම් රණවිරුවාගේ ආබාධිත ප්‍රතිශත වාර්තාව හෝ සේවය කරන ලද ස්ථානයෙන් ලබාගත් ලිපිය, යු ආ ගි 21 හෝ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ පිටපතක්)
iv. සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද රණවිරුවාගේ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
v. මව පියාගේ ජාතික හැඳුනුම්පත් පිටපත්
vi. අදාළ බැංකුවෙන් සහතික කරන ලද මාපිය රැකවරණ ගිණුම් පිටපත්

ඉහත සුදුසුකම් සපුරන ලද රණවිරු මව්පියන්ට පහත සඳහන් පිළිවෙලට මාපිය රැකවරණ දීමනාව ගෙවනු ලබයි.

i. රණවිරු දෙමාපියන් විසින් මාසිකව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ලිපිකරු විසින් පරීක්ෂා කර නිර්ණායකයන්ට අනුකූලව ඇත්දැයි පරීක්ෂා කර සම්පූර්ණ අයදුම්පත් පරිගණකගත කිරීම සඳහා ලබාදෙයි
ii. ලියකියවිලි සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් පරිගණක ක්‍රියාකරු විසින් පරිගණක ගත කර අයදුම්පත නැවත පරීක්ෂා කරනු ලැබේ.
iii. අංශ ප්‍රධානි විසින් දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරන ලද අයදුම්පත හා අදාළ ලියකියවිලි පරීක්ෂා කර සනාථ කරනු ලබයි.
iv. අංශ ප්‍රධානි විසින් සභාපතිතුමාගේ අනුමැතිය සඳහා යොමු කරන පරිගණකගත කරන ලද රණවිරු දත්ත සභාපතිතුමාගේ අනුමැතියෙන් පසු සක්‍රිය ගිණුමක් බවට තහවුරු කරනු ලැබේ.
v. අයදුම්පත් පරිගණක ගත කිරීමේ ක්‍රියවලියෙන් පසු පහත සඳහන් ආකාරයට මාපිය රැකවරණ ව්‍යාපෘතිය මාසිකව බැරකිරීම සඳහා බැංකු වවුචරය මඟින් අනුමැතිය ලබාගනු ලබයි.
vi. අංශ ප්‍රධානි විසින් ගෙවීම් සාරාංශය සභාපතිතුමා හෝ අධ්‍යක්ෂකතුමා වෙත ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත් පසුගෙවීම් තහවුරු කිරීමෙන් අනතුරුව සහකාර අධ්‍යක්ෂක (මූල්‍ය) මඟින් මාසික මාපිය රැකවරණ දීමනාව බැංකු ගත කිරීමේ කටයුතු කෙරේ.

15.4. 2023 වර්ෂයේ ප්‍රතිලාභීන් විවලනය හා මුදල් බැර කිරීම

අ.අ.	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබා ගත් ප්‍රමාණය	වැය වූ මුදල (රු)
1	ජනවාරි	34264	94	134	34224	26,907,000.00
2	පෙබරවාරි	34224	64	98	34190	26,360,250.00
3	මාර්තු	34190	51	91	34150	25,972,500.00
4	අප්‍රේල්	34150	54	39	34165	26,251,500.00
5	මැයි	34165	36	59	34142	26,134,500.00

අ.අ.	මාසය	පවත්වාගෙන එන ගිණුම්/ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	ඉවත් කිරීම්	මාසයේ ප්‍රතිලාභ ලබා ගත් ප්‍රමාණය	වැය වූ මුදල (රු)
6	ජුනි	34142	46	57	34131	26,068,500.00
7	ජුලි	34131	95	84	34142	26,856,000.00
8	අගෝස්තු	34142	76	69	34149	26,871,750.00
9	සැප්තැම්බර්	34149	49	62	34136	25,764,000.00
10	ඔක්තොම්බර්	34136	32	57	34111	25,611,000.00
11	නොවැම්බර්	34111	49	133	34027	25,691,250.00
12	දෙසැම්බර්	34027	0	0	34027	25,520,250.00
	එකතුව	409831 සාමාන්‍යය - 34152	646	883	409594 සාමාන්‍යය - 34132	314,008,500.00

16
විරුසර වරප්‍රසාද කාඩ්පත් ව්‍යාපෘතිය


16.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ජීවිත පූජා කල සහ අබාධිත වූ ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ මෙන්ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ ඔවුන්ගේ ලහම ඥාතීන්ගේ සුභසාධනය ඉහළ නැංවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ රණවිරු සේවා අධිකාරිය වෙතින් ඉහත කී රණවිරුවන් වෙනුවෙන් නිසි ගෞරවයක් ලබාදීම සහ ඔවුන්ගේ එදිනෙදා ජීවන කටයුතු ප්‍රමුඛතාවය මත ඉටු කර ගැනීමේ මෙහෙවරක් වශයෙන් විරුසර නමින් වරප්‍රසාද කාඩ්පතක් පිරිනමනු ලබයි.

2023.04.28 තෙක් නිකුත් කරන ලද පැරණි කාඩ්පත් වසර 05ක් සඳහා පමණක් වලංගු වූ අතර, වසර 05න් පසු වලංගු කාල සීමාව අවසන් වන බැවින් නව කාඩ්පතක් ලබා ගැනීම සිදු කළ යුතු විය. නමුත් 2023.04.28 දින සිට නිකුත් කරනු ලබන නව කාඩ්පත් කල් ඉකුත්වීමක් සිදුනොවේ. මෙම කාඩ්පත අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

පළමු අදියරය - යුධමය කාලසීමාව තුළ ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තුමේන්තුව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ යෙදී සිටියදී ක්‍රියාන්විතයේදී ජීවිත පරිත්‍යාග කල සහ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ලඟම ඥාතීන් හෝ භාරකරු වෙත සහ ක්‍රියාන්විතයෙදී අබාධිත තත්වයට පත් රණවිරුවන්ගේ සුභසාධනය උදෙසා පළමු අදියර ක්‍රියාත්මක වේ. එහිදී මෙම කාඩ්පත ලබාගැනීමේදී රණවිරු සංසද හරහා දිස්ත්‍රික් නිලධාරි මඟින් රණවිරු සේවා අධිකාරිය වෙත ඉදිරිපත් කර හෝ රණවිරු සේවා අධිකාරිය වෙත පැමිණ ලබාගත හැක.

දෙවන අදියරය - 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල යහපත් පැවැත්මෙන් යුතුව සේවය කර විශ්‍රාම ගිය හා එම වකවානුව අතුලත ත්‍රිවිධ හමුදාවට, පොලීසියට සහ සිවිල් ආරක්ෂක බලකායට බැඳී තව දුරටත් සේවයේ යෙදී සිටින සියලුම රණවිරුවන්ට හා ඉහත කාල සීමාව තුලදී ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරියේ යෙදී සිටියදී මියගිය, අතුරුදහන් හා ආබාධිත සිවිල් සේවක මහතුන් ඇතුළුව නිලධාරීන් සඳහා නියමිත වසර 20 ක හෝ සෙසු නිලයින් සඳහා නියමිත වසර 22 ක් කාන්තා අයවලුන් හට වසර 15 ක සේවා කාලය සපුරා දැනට විශ්‍රාම ගොස් සිටින හෝ සේවයේ යෙදී සිටින රණවිරුවන් වෙත විරුසර කාඩ්පත පිරිනමනු ලබයි. මෙම කාඩ්පත ලබාගැනීමේදී ඒකක, රෙජිමේන්තු සහ අදාල හමුදාවන්හි සුභසාධන අංශ හරහා රණවිරු සේවා අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.



පැරණි කාඩ්පත



නව කාඩ්පත

16.2. 2023 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රමාණය

අදියර	සේවාව					එකතුව
	යුද හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	පොලිස් දෙ.	සි. ආ. දෙ.	
අදියර I	1740	1521	908	135	1793	6097
අදියර II	793	50	10	59	2	914
එකතුව	**2533**	**1571**	**918**	**194**	**1795**	**7011**

16.3. 2023 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති කාඩ්පත් ප්‍රමාණය

අ.අ.	මාසය	යුධ හමුදාව	නාවික හමුදාව	පොලිස් දෙ.	ගුවන් හමුදාව	සි.ආ.දෙ.	එකතුව
1	ජනවාරි	87	20	3	10	-	120
2	පෙබරවාරි	50	51	0	-	-	101
3	මාර්තු	65	62	2	1	-	130
4	අප්‍රේල්	47	52	-	24	-	123
5	මැයි	21	23	2	3	-	49
6	ජූනි	389	242	19	43	123	816
